**ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.**

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 තත්ත්වාගණනය කළ මතය.

ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම.

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| 1.6.3.(ආ) | (i) | 2021 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.23,262,468,064 ක් වූ අතර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ACA-6) හා භාණ්ඩාගාර මුද්‍රිත SA 82 අනුව මිල දී ගැනීම් වටිනාකම රු.1,371,353,774 ක් විය. ඒ අනුව වෙනස රු.21,891,114,290 ක් විය. | 1.5.1 (ඇ) (i) |
| | (ii) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.245,322,655,012 ක් වුවද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂය ලෙස රු.480,429,150,059 ක් දක්වා තිබුණි. ඒ අනුව වෙනස රු.235,106,495,047 ක් විය. | 1.5.1 (ඇ) (ii) |
| | (iii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය සමඟ සැසඳීමේ දී වෙනසක් තිබේ නම් එම වෙනස පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කිරීමේ පදනම යටතේ සටහනක් මගින් හෙළිදරව් කල යුතු වුවත් එසේ කර නොතිබුණි. | 1.5.1 (ඇ) (iii) |
| 1.6.3.(ඉ) | (i) | 2021 දුම්රිය දෙපාර්තමේන්තුවේ ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. එම නිසා මෙම ගිණුම් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හෝ රාජ්‍ය අංශ ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කළේද යන්න විගණනයේදී හෙළිදරව් නොවීය. | 1.5.1 (ඉ) (i) |
| | (ii) | විගණනයට ඉදිරිපත් කරන ලද අත්තිකාරම් ගිණුම සකස් කිරීමේ අරමුණු සහ එහි විෂය පථය ගිණුම මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 1.5.1 (ඉ) (ii) |
| | (iii) | ගබඩා අත්තිකාරම් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව සමාන නොවීම හේතුවෙන් රු.403,366,221 ක් වූ එම වෙනස අධි තක්සේරු වීම් ලෙස දක්වා තිබුණි. | 1.5.1 (ඉ) (iii) |
| 1.6.3.(ඊ) | (i) | දෙපාර්තමේන්තු පොත් අනුව පාලන ගිණුමේ ආරම්භක ශේෂය රු. 1,269,564,455 ක් වූ අතර එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු. 1,273,742,260 ක් විය. මේ අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.4,177,805 ක වෙනසක් පැවතුණි. 2004 වර්ෂයේ සිට මේ වන විට වසර 17 ක් ඉක්ම ගොස් ඇතත් මෙම ශේෂය නිරවුල් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1.5.1 (ඊ) (i) |
| | (ii) | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ හා දෙපාර්තමේන්තු පාලන ගිණුම අතර පවතින රු.1,620,898 ක වෙනස තුළ හඳුනා නොගත් රු.716,977 ක ශේෂයක් පැවතුණි. | 1.5.1 (ඊ) (ii) |

| | | | |
|---|---|---|---|
| | **(iii)** | දැනට සේවයේ නොමැති නිලධාරීන්ගෙන් අයවීමට රු.108,685,041.44 ක ශේෂයක් පැවතුණි. | 1.5.1 (ඊ) (v) |
| 1.6.4. | **(i)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුමේ දක්වා තිබූ රු.268,627,824 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව කාල විශ්ලේෂණ හා සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 1.5.2 (අ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**(අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ ශුද්ධ වත්කම් අගය තහවුරු කර ගැනීම සඳහා එහි අන්තර්ගතය ඇතුලත් ශේෂ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබූ හෙයින් එම අගය තහවුරු කර ගත නොහැකි විය. | ගිණුම තුළ නිරූපණය කර ඇති ශුද්ධ වත්කම් අගය සැකසී ඇත්තේ ගිණුම්මය ගණනය කිරීමක් ලෙස මුළු වත්කම් වටිනාකමින් ජංගම වගකීම් සහ දේපළ පිරියත සහ උපකරණ සංචිත අගය ඉවත් කිරීමෙන් වේ. ඒ අනුව ශේෂ වාර්තාවක් ලෙස වෙන්කර පිළියෙළ කිරීමක් සිදු කර නැත. | ශේෂය තහවුරු කර ගැනීමට අන්තර්ගතය ඇතුළත් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීම කළ යුතුවේ. |
| **(ii)** | 2015 දෙසැම්බර් 31 දිනට පෙර පැවති දුම්රිය සාමාන්‍යාධිකාරීගේ අපෞද්ගලික ගිණුමට ආදාලව ලැබිය යුතු ලෙස සටහන් විය යුතු රු.1,000,515,781 ක මුදලින් 2022 වසර තුලදී රු.740,148,051 ක මුදලක් අය වූ බව වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කර තිබුණද ඉතිරි ලැබිය යුතු රු.260,367,030 ක මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හෙළිදරව් කර නොතිබුණි. | 2022 වසර තුළදී රු.740,148,051 ක මුදලක් "අය වූ බව" වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කර නොමැත. ඉදිරියේ දී වෙන්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශ තුළ හෙළිදරව් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | ලැබිය යුතු මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හෙළිදරව් කළ යුතුවේ. |

**(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස රු.740,148,051 ක මුදලක් | 2022 මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙකී ගැලපීමේ සටහන 8003 දුම්රිය සාමාන්‍යාධිකාරීගේ ගිණුම හා සම්බන්ධ ද්විගණන දෝෂයක් නිවැරදි | ලැබීම් ගිණුම්ගත කිරීමේදී ලද ආකාරය හෙළිදරව් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | දක්වා තිබුණද එම ආදායම දුම්රිය දෙපාර්තමේන්තුවට ලද ආකාරය ගිණුම් වල හෙළිදරව් කර නොතිබුණි. | කිරීම සඳහා යොදන ලද්දකි. ඒ අනුව මෙම මුදල දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඔබ විසින් සඳහන් කළ ආකාරයක ලැබීමක් ලෙස 2022 වර්ෂයේ වාර්තා කර නොමැත. මෙම ගැලපීමේ හරස් සටහන මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කිරීමට පදනම් වූයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් උපදෙස් මාලාවට අනුව සියළු හරස් සටහන් ලැබීම් සහ ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු බවට වූ උපදෙස් අනුව ය. | |
| **(ii)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දුම්රිය සාමාන්‍යාධිකාරිගේ අපෞද්ගලික ගිණුමට ලැබීම් ලෙස ඉහත රු.740,148,051 ක මුදල දක්වා තිබුණද එම ආදායම මූල්‍ය ක්‍රියාකාරකම මඟින් ජනිතවූ ආදායමක් ද යන්න ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | මෙහි දී සත්‍ය වශයෙන් මුදල් ප්‍රවාහයක් නොවන අතර ද්විගණනයේ දෝෂයක් නිවැරදි කිරීම සඳහා යොදන ලද හරස් සටහනක් පමණක් වේ. එමෙන්ම, මෙම දුම්රිය සාමාන්‍යාධිකාරිගේ අපෞද්ගලික ගිණුම භාණ්ඩාගාරය දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ මූල්‍යමය වශයෙන් සම්බන්ධීකරණයවීම සඳහා පවත්වා ගන්නා ලද්දක් බැවින් එම ගිණුම සම්බන්ධ සියළු ගනුදෙනු මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. | ලැබීම් ජනිත වූ ආකාරය ගිණුම් තුළ හෙළිදරව් කළ යුතුවේ. |

**(ඇ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශය.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ වෙනත් ආයතන වලට නිලධාරීන් මාරුවී යාමේදී පවරා දුන් ණය සහ රජයේ වෙනත් ආයතන වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට කරන ලද හර කිරීම්, අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ හර ශීර්ෂය යටතේ වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කළ යුතු වුවත් එය සමුච්චිත අගයක් ලෙස දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයක් නිසා මෙය සිදු වී ඇත. දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව වෙනත් ආයතන වෙනුවෙන් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට ආයතන 06ක් යටතේ හර කිරීම් සිදු කර ඇත. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ හර ශීර්ෂය යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතුවේ. |

| **ශීර්ෂ අංකය** | **ආයතනයේ නම** | **මුදල (රුපියල්)** |
|---|---|---|
| 001012 | ජනාධිපති ලේකම් කාර්යාලය | 15,430.00 |
| 126012 | අධ්‍යාපන අමාත්‍යාංශය | 13,200.00 |

| | | |
|---|---|---|
| 226012 | ආගමන විගමන දෙපාර්තමේන්තුව | 8,750.00 |
| 276012 | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 245,000.00 |
| 331012 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 134,136.00 |
| 409012 | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 312,410.40 |
| | එකතුව | 728,926.40 |

**(ඈ) මූල්‍ය නොවන වත්කම්.**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2022 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව වත්කම් අත්පත් කර ගැනීමට අදාලව ප්‍රාග්ධන වැය විෂයය අනුව වටිනාකම රු.15,285,208,816 ක් වූ අතර ගිණුමෙහි හා භාණ්ඩාගාර මුද්‍රිත SA 82 අනුව මිල දී ගැනීමේ වටිනාකම රු.2,403,765,858 ක් විය. ඒ අනුව වෙනස රු.12,881,442,958 ක් විය. | වත්කම් අත්පත් කර ගැනීමට අදාලව ප්‍රාග්ධන වැය විෂයය අනුව වටිනාකම රු.12,881,442,958 ක අගයෙන් රු.11,608,193,150 ක අගය යටතේ ඇත්තේ විදේශීය ණය යටතේ මිල දී ගත් වත්කම් වන අතර, මෙම දෙපාර්තමේන්තුවේ වත්කම් ඒකක වශයෙන් හඳුනාගැනීම සිදු වන්නේ ඊට අදාල සියළු වියදම් දැරීමෙන් පසුව වේ. ඒ අනුව ඊට අනුගත වීම සඳහා මෙම ක්‍රමවේදය සීගාස් වැඩසටහන තුළත් ක්‍රියාත්මක කරනු ලබයි. | වත්කම් මිලදී ගැනීම් භාණ්ඩාගාරයට නිවැරදිව වාර්තා කළ යුතුවේ. |
| **(ii)** | 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.481,800,503,833 ක් වුවද මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ආරම්භක ශේෂය ලෙස රු.481,859,585,384 ක් දක්වා තිබුණි. ඒ අනුව වෙනස රු. 59,081,551 ක් විය. | 2022 ගිණුම් වර්ෂය තුළ දී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වන රු.59,081,551.00ක වටිනාකම 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ආරම්භක ගිණුම් ශේෂය ලෙස ගිණුම්ගත කරනලද අතර මෙම අගය එම වටිනාකම වේ. | සමාලෝචිත වර්ෂයේ ශේෂ ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය සමඟ සැසඳීමේ දී වෙනසක් තිබේ නම් මූල්‍ය ප්‍රකාශනයේ සටහනක් මගින් හෙළිදරව් කල යුතුවේ. |

**(ඉ) ගබඩා අත්තිකාරම් ගිණුම.**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2022 දුම්රිය දෙපාර්තමේන්තුවේ ගබඩා අත්තිකාරම් ගිණුම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. එම නිසා මෙම ගිණුම් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම හෝ රාජ්‍ය අංශ ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සකස් කළේද යන්න විගණනයේදී හෙළිදරව් නොවිය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුවේ. |
| **(ii)** | විගණනයට ඉදිරිපත් කරන ලද අත්තිකාරම් ගිණුම සකස් කිරීමේ අරමුණු සහ එහි විෂය පථය ගිණුම මඟින් හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අරමුණු හා විෂය පථයන් හෙළිදරව් කළ යුතුවේ. |
| **(iii)** | ගබඩා අත්තිකාරම් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත අනුව ශේෂයට සමාන විය යුතු වුවද, එසේ නොවීම හේතුවෙන් රු.403,366,221 ක් අධිතක්සේරු වීම් ලෙස සඳහන් කර දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයෙන් අඩුකර භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂයට සමාන කර තිබුණි. | දිගුකලක සිට පැවත එන පැරණි ශේෂ බැවින් නිරවුල් කිරීමේ ප්‍රමාදයක් පවතින බව පිළිගනිමි. ඊට හේතුව පෙර දැක්වූ පරිදි නිවැරදි මූලාශ්‍ර තොරතුරු වෙත ප්‍රවේශවීමේ අපහසුතාවය බව සඳහන් කරමි. මෙම ගිණුම සකස් කිරීමේදී භාණ්ඩාගාරයේ සඳහන් ශේෂය සමඟ ගැලපීමට යොදා ඇති බවත්, මෙමගින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂයේ අඩුවීමක් පෙන්නුම් නොකරන අතර භාණ්ඩාගාරය විසින් දක්වනු ලබන ශේෂයට අනුව දෙපාර්තමේන්තු පොත් ශේෂය නිවැරදි කිරීම පමණක් සිදු කර ඇත. | අධි තක්සේරුවීම් ලෙස ගිණුමේ දක්වා ඇති ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| **(iv)** | 1993 වර්ෂයේ සිට 2022 දක්වා භාණ්ඩ ආනයනයේදී රේගු ගාස්තු වශයෙන් දරණ ලද රු.78,197,076 ක වියදම තොගයට ගැලපීමට කටයුතු නොකිරීම හේතුවෙන් තොග වටිනාකම රු.78,197,076 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනය දක්වා ඇති කරුණුවලට එකඟ වෙමි. භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් නොවීම නිසා මෙලෙස විශාල අගයන් නිරූපණය වුවද, මෙම අගයන් පහත පරිදි 2023 අප්‍රේල් මස වනවිට රු 29,653,733ක් තොගයට ඇතුළත් කර ඇත. ඉදිරියේදී භාණ්ඩ ලැබීම් පත්‍ර කඩිනමින් ලබාගෙන මෙම ශේෂයන් තොගයට ඇතුළත් කිරීමේ කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | රේගු ගාස්තු වටිනාකම තොගයට ගැලපීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(v)** | SPL 3060/21 යටතේ සංඥා උපකරණ ලබා ගැනීම සඳහා සංඥා උප දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ මඟින් වැය කළ යුතු රු.22,215,365 ක් ගබඩා අත්තිකාරම් ගිණුමේ වර්ෂයේ වියදම් ලෙස දැක්වීම හේතුවෙන් ගබඩා අත්තිකාරම් ගිණුමේ වර්ෂය තුල හර කිරීම් රු.22,215,365 ක් වැඩියෙන් දක්වා තිබුණි. | SPL 3060/21 යටතේ සංඥා උපකරණ ලබා ගැනීම සඳහා සංඥා උපදෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ මඟින් වැය කළ යුතු රු. 22,215,365 ක් වර්ෂ අවසානයේ වැය ශීර්ෂ ප්‍රමාණවත් නොවීම මත ගබඩා අත්තිකාරම් ගිණුම යටතේ වියදමක් ලෙස දක්වා ඇති අතර 2023 ජනවාරි මස මෙම වටිනාකම සංඥා උපදෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයට හර කර නිවැරදි කර ඇත. | අදාළ ගෙවීම් පමණක් වර්ෂය තුළ හර කිරීම් වල ඇතුළත් කළ යුතුවේ. |
| **(vi)** | 2022 ජූලි මස ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය මඟින් නිරවුල් කරන ලද රු.32,767,012 ක ගබඩා බිල්පත් වටිනාකම 2022 නොවැම්බර් මස අවලංගු කර පැවතියද එම වටිනාකම වර්ෂයේ ලැබීම් ලෙස ගිණුම් ගත වීම හේතුවෙන් වර්ෂය තුළ බැර කිරීම් රු.32,767,012 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 ජූලි මස ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය මගින් නිරවුල් කරන ලද රු.32,767,012ක ගබඩා බිල්පත් වටිනාකම 2022 නොවැම්බර් මස උප දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ ප්‍රමාණවත් නොවීම මත ගබඩා අත්තිකාරම් ගිණුමට හර කර ඇත. තවද එම අගය 2023 ජනවාරි මස ගබඩා අත්තිකාරම් ගිණුමට බැර කර ඇත. | අදාළ ලැබීම් පමණක් වර්ෂය තුළ බැර කිරීම් වල ඇතුළත් කළ යුතුවේ. |

**(ඊ)** **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම.**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2022 වර්ෂය ආරම්භයේ දී දෙපාර්තමේන්තු පොත් අනුව පාලන ගිණුමේ ආරම්භක ශේෂය රු.1,118,983,421 ක් වූ අතර එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.1,123,161,226 ක් විය. මේ අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.4,177,805 ක වෙනසක් පැවතුණි. 2004 වර්ෂයේ සිට මේ වන විට වසර 18 ක් ඉක්ම ගොස් ඇතත් මෙම ශේෂය නිරවුල් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2004 වර්ෂයේ දුම්රිය දෙපාර්තමේන්තුව අධිකාරියක් බවට පත් කිරීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ ණය හා අත්තිකාරම් ගිණුම් හා පියවීම් කටයුතු ප්‍රවාහන අමාත්‍යාංශය මගින් සිදු කළ අතර මාසික වාර්තා අවසාන ගිණුම් සකස් කිරීම හා ගිණුම් සැසඳීම, වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම අමාත්‍යාංශය මගින් සිදු කර ඇත. එම කාලවකවානුව තුළ දී භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර රු.4,177,805 ක වෙනසක් ඇති වී ඇත. 2004 සිට මේ දක්වා එම ශේෂය දිගින් දිගටම පවත්වාගෙන යනු ලබයි. | වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ හා දෙපාර්තමේන්තු පාලන ගිණුම අතර පවතින රු.836,508 ක වෙනස තුළ හඳුනා නොගත් රු. 716,507 ක ශේෂයක් පැවතුණි. මේ ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පෙර වර්ෂයන්හි විශ්‍රාම ගිය සහ මිය ගිය සේවකයින්ගෙන් අය විය යුතු හිඟ ණය ශේෂ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙතින් ලැබී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ පාලන ගිණුමට බැර වී ඇති නමුත් ශේෂ කපා හැරීමට ප්‍රමාණවත් විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙතින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් නොලැබීම හේතුවෙන් නිශ්චිතව කපා හැරීමට නොහැකිව කේවළ ශේෂ ලේඛණවල තවදුරටත් රඳවාගත් ණය ශේෂය රු.716,507ක් වී ඇත. එසේ තහවුරු නොවූ තොරතුරු ලබා ගැනීමට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගොස් පැරණි ලේඛණ පරීක්ෂා කිරීමෙන් සොයා ගන්නා ලදි. | වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| **(iii)** | සේවය හැර ගිය උප දෙපාර්තමේන්තු 19 ක නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.26,400,397 ක ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර එම ණය ශේෂයන්ගෙන් සියයට 64 ක ප්‍රතිශතයක් වසර 05 කට වඩා වැඩි ණය ශේෂ විය. | 2022.12.31 දිනට සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂය රු.26,400,397.64කි. ඉන් ප්‍රධාන ඉංජිනේරු (ධාවනබල) උපදෙපාර්තමේන්තුව යටතේ නිලධාරීන් තිදෙනෙකුගේ රු.603,360.00ක මුදලක් මෙම වර්ෂය ඇතුළත අය කර ඇත. දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය යටතේ සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ රු.494,535.49ක ණය ශේෂය අය කර ගැනීම සඳහා හදිසි වැටලීම් අංශය හා නීති අංශය කටයුතු කරමින් පවතී. | පැරණි ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(iv)** | උප දෙපාර්තමේන්තු 16 ක වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.16,251,146 ක ණය ශේෂ ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඉන් සියයට 68 ක් වූ රු.11,195,178 ක ණය ශේෂය වසර 05 ට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබූ අතර එම ණය ශේෂයන්ගෙන් 34% ක් ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල) උප දෙපාර්තමේන්තුවට අයත් විය. | ප්‍රධාන ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව යටතේ වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 05 දෙනෙක් නැවත සේවයේ පිහිටුවීම සඳහා අභියාචනා යොමු වී ඇත. එවිට එම නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමේ හැකියාව ඇත. අනෙකුත් අය කිරීම් සඳහා ණයකරුවන්ගේ ඇපකරුවන් පිළිබඳ තොරතුරු කැබිනට් අංශ මගින් ගෙන්වා ගැනීමට කටයුතු යොදා ඇත. | පැරණි ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(v)** | අය වීමට ඇති මුළු අත්තිකාරම් ශේෂයෙන් 09% කට ආසන්න ප්‍රමාණයක් එනම් රු.102,372,296 ක් සේවා නියුක්ත නැති නිලධාරීන්ගෙන් වන අතර ඉන් 45% කට ආසන්න ප්‍රමාණයක් විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් සමන්විතවී තිබුණි. තවද සේවය අතහැර ගොස් ඇති, වසර 05 කට වඩා වැඩි කාලයක් ඉක්ම ගොස් ඇතත් අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට නොහැකි වී ඇති ප්‍රමාණය රු. 16,865,419 ක් විය. මෙය සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු අත්තිකාරම් වලින් 16% ක් වී තිබුණි. | විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන්ගෙන් වැඩි ප්‍රමාණයක් මෑතක දී එකතු වූ ශේෂයන් වන අතර රටේ පවත්නා වත්මන් මූල්‍ය අර්බුදය හේතුවෙන් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමේ කටයුතු ද ප්‍රමාද වී ඇත. 2023.04.30 දින වන විට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු රු.1,219,285.00ක ණය ශේෂයක් පසු ගිය මාස 04 ඇතුළත අය කර ඇත. සේවා නියුක්ත නැති නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂ ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර අවුරුදු 5ට වැඩි කාලයක් ඉක්ම ගොස් ඇති ණය ශේෂ වැඩි ප්‍රතිශතයක් අවුරුදු 15කට පමණ පෙර හිඟ සිටි ශේෂ බැවින් තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතා පවතී. | පැරණි ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**(උ)** **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | **හිඟ ආදායම් සම්බන්ධ ලේඛණය**<br>මුදල් රෙගුලාසි 454(3) හා මුදල් රෙගුලාසි 177(4) හිඟ ආදායම් සම්බන්ධ ලේඛණය පවත්වා නොතිබුණි. | ආදායම් රැස් කරනු ලබන හා වාර්තා කරනු ලබන අංශවල හිඟ ලේඛණ නඩත්තු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. එබැවින් ඒකාබද්ධ හිඟ ආදායම සම්බන්ධ ලේඛණයක් නඩත්තු කිරීමක් සිදු කරනු නොලබයි. | මුදල් රෙගුලාසි 454(3) හා මුදල් රෙගුලාසි 177(4) ප්‍රකාරව හිඟ ආදායම් සම්බන්ධ ලේඛණය පවත්වාගෙන යා යුතුවේ. |

**(ii)** බැරකම් පිළිබඳ ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව ජර්මන් කාර්මික ආයතනය, ප්‍රවාහන අධිකාරී (කොළඹ), ප්‍රවාහන අධිකාරී (අනුරාධපුරය) හා සංඥා හා සන්නිවේදන යන උප දෙපාර්තමේන්තු 04 හි බැරකම් ලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුවේ. |

**(ඖ)** **විගණන සාක්ෂි නොවීම.**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුමේ ඉදිරිපත් කර තිබූ රු.935,903,785 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව කාල විශ්ලේෂණ, සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්තේක්ෂණය කිරීමට නොහැකි විය. | • **විවිධ ණයගැතියෝ -** ගබඩා අත්තිකාරම් ගිණුම තුළ ලැබිය යුතු මුදල් පිළිබඳ කාල විශ්ලේෂණයක් ද සකස්කර ඇත.<br>• **අත්තිකාරම් හා තැන්පත් -** ශේෂ සනාථ කිරීමට කටයුතු කරන මෙන් අදාල ආයතන වෙත ලිපි මගින් දන්වා ඇත.<br>• **භාණ්ඩ තොග අඩුවෙන් සැපයීම, 1998-2009 නිරවුල් නොවූ ණයවර ලිපි, විවිධ ණයහිමියෝ -** ඉතා පැරණි ශේෂයන් හේතුවෙන් එම තොරතුරු හඳුනා ගැනීමෙන් අනතුරුව ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. මූලාශ්‍ර සොයා ගැනීමේ අපහසුව හා කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම මත ඉහත ශේෂයන් හඳුනා ගැනීමට හා නිවැරදිව ඉදිරිපත් කිරීමට සැලකිය යුතු කාලයක් අවශ්‍යව ඇත. | තහවුරු කිරීමට අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු නොකරන අතර හිඟ ආදායම ගණනය කරනු ලබන්නේ එක් එක් අංශ වලින් ලබා දෙන ආදායම් තොරතුරු අනුව විය. ඒ අනුව ගිණුමෙහි දක්වන සංඛ්‍යාවල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | දුම්රිය ආදායම් ශීර්ෂය සම්බන්ධයෙන් සමුච්චිත හිඟ ආදායම ගණනය කිරීමේ දී සම්ප්‍රදායක් ලෙස අංශ කිහිපයකින් ලබා ගන්නා තොරතුරු පදනම් කර ගනියි. එ් ඒ අංශවල හිඟ ලේඛණ නඩත්තු කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. එබැවින් ඒකාබද්ධ හිඟ ආදායම සම්බන්ධ ලේඛණයක් නඩත්තු කිරීමක් සිදු කරනු නොලබයි. | තහවුරු කිරීමට අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය.**

**2.1** **ආදායම් කළමනාකරණය.**

ආදායම් රැස්කිරිම, හිඟහිටි ආදායම් රැස්කිරිම, සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | **ආදායම්** | | |
| **(i)** | ගාල්ල දුම්රිය ස්ථානයේ පළමු මහලේ ඇති ගබඩා කාමර දෙක හා දුම්රිය සාමාන්‍යාධිකාරීට වෙන් කර ඇති කාමර හැර ඉතිරි කාමර 08 කුලියට දීම මගින් 2017 හා 2018 වර්ෂ වලට සාපේක්ෂව 2020 හා 2021 වසරේ ආදායම පිළිවෙලින් රු. 552,805 ක් හා රු.687,900 කින් පහත වැටී තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි | ආදායම පහත වැටීමට හේතු සොයා බලා ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | වැලිගම දුම්රිය ස්ථානයේ ගිණුම් අනුව 1988 සිට පවතින රු.189,041 ක දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ශේෂයක් වූ අතර 2022 ජුනි 09 වන විට වර්ෂ 33 කට වැඩි කාලයක් ගත වී ඇතත් එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි | දිගු කාලීනව පැවත එන ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |
| **(iii)** | මහනුවර සිට ඇල්ල දක්වා ධාවනය කරනු ලබන ODESSEY විශේෂ දුම්රියේ, තුන්වන පන්තියේ ආසන 50 ක් තිබුණ ද, මාර්ගස්ථ ක්‍රමය යටතේ වෙන්කිරීමේ හැකියාව පවතින්නේ එයින් 76% ක් එනම් ආසන 38 ක් පමණක් විය. මාර්ගස්ථ ක්‍රමයට ආසන වෙන් කිරීමේදී, රජයේ සේවකයින්ගේ දුම්රිය බලපත්‍ර වලට ඉඩ ලබාදීම සඳහා සපයා ඇති පහසුකම් මෙම | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි | මාර්ගස්ථ ක්‍රමයට ආසන වෙන් කිරීමේදී ඇති වී තිබෙන ගැටළුව නිරාකරණය කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | පද්ධතියට බලපා ඇති අතර රජයේ දුම්රිය වොරන්ට් බලපත්‍ර මෙම දුම්රිය සඳහා වලංගු නොවන බැවින් 2022 මාර්තු 05 දින සිට 2022 මාර්තු 31 දින දක්වා දිනකට ආසන 12 බැගින්, දින 27 කට ආසන 324 ක් සඳහා රු.4000 මගින්, රු.1,296,000 ක ආදායමක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. | | |
| **(iv)** | බණ්ඩාරවෙල ස්ථිර මාර්ග පරීක්ෂක බලප්‍රදේශය 2ND Hands Rails නැවත අලුත්වැඩියා සඳහා ලබාගෙන තිබීම ඉතා සුළු වශයෙන් පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව අලුත්වැඩියා සඳහා යම් ප්‍රමාණයක් තබා ගෙන, දැනට අනාරක්ෂිතව, තැනින් තැන ගොඩගසා ඇති ඉහත සඳහන් Rails තත්කාලයේ වෙළඳපල යකඩ මිල ගණන් අනුව කි.ග්‍රෑ1 ක් රු.110/= බැගින් විකිණීම සිදුකරනු ලැබුවේ නම්, ඒ සඳහා රු. 36,370,352 ක ආදායමක් දෙපාර්තමේන්තුවට උපයා ගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම් ජනිත වන මාර්ග සොයා බලා එම ආදායම් දෙපාර්තමේන්තුව වෙත උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(v)** | ගම්පහ දුම්රිය ස්ථානයේ ඇති සෝයා අයිස් ක්‍රීම් වෙළඳසැල, මිල්කෝ කිරිහල, කොළ කැඳ අලෙවි සැල මගින් ලැබිය යුතු හිඟ ආදායම හා හිඟ විදුලි ගාස්තු වටිනාකම රු.1,340,887 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(vi)** | රජයේ ආයතනයකින් ලැබිය යුතු හිඟ ප්‍රවාහන ගාස්තු වටිනාකම රු.3,323,654 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එය 2,514,480 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් හිඟ ප්‍රවාහන කුලී වටිනාකම රු.809,174 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි වටිනාකම් දැක්විය යුතුවේ. |
| **(vii)** | පෞද්ගලික ආයතනයකින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ප්‍රවාහන ගාස්තුව රු.1,276,178 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එය රු.455,554 ක් ලෙස රු.820,624 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ප්‍රවාහන ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(viii)** | පෞද්ගලික සමාගමකින් 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අයවිය යුතු හිඟ ප්‍රවාහන ගාස්තුව රු.8,026,382 ක් වුවත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ප්‍රවාහන ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| **(ix)** | දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ලිමිටඩ් ආයතනයෙන් 2022 වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු හිඟ ප්‍රවාහන කුලී ආදායම රු.466,884,519 ක් විය. එහෙත් දෙපාර්තමේන්තුව විසින් අවසාන මූල්‍ය ප්‍රකාශන සඳහා ගෙන ඇති හිඟ ප්‍රවාහන කුලී ආදායම රු.156,988,929 ක් වන අතර එම ශේෂය අතරින් රු. 53,998,190 ක් 2008 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ පැරණි ශේෂයන් විය. ඒ අනුව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් හිඟ ප්‍රවාහන කුලී ආදායම රු.309,895,590 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ප්‍රවාහන ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| **(x)** | 2005 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාල සීමාව තුල දුම්රිය දෙපාර්තමේන්තුව විසින් වෙස්රෝයි විශේෂ දුම්රිය සම්බන්ධයෙන් සිදු කරන ලද අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් අදාළ පුද්ගලික සමාගමෙන් රු.6,119,582 ක මුදලක් අයවිය යුතුව ඇතත් ඒ මුදල ගිණුම් ගත කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| **(xi)** | කොළඹ බඩු ගබඩා සංකීර්ණයේ CI-G බඩු ගබඩා ගොඩනැගිල්ලෙන් 2021 මැයි 06 දිනට අයවිය යුතු හිඟ බදු කුලී ආදායම රු. 393,128 ක මුදල ගිණුම් ගත කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |

**(ආ) දුම්රිය රක්ෂිතයන් බදු දීම නිසා ලැබිය යුතු හිඟ බදු ආදායම.**

| | | | |
|---|---|---|---|
| | දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් බදු දීම තුළින් ලැබිය යුතු රු. 79,894,344 ක හිඟ ආදායම් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන වලටද ඇතුළත් කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | බදු ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුවේ. |

## 2.2 වියදම් කළමනාකරණය.

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරිම,ප්‍රතිපාදන මාරු කිරීම් හා ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් තොරව වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම හේතුවෙන්, | | |
| **(i)** | වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම තුළින් රු.1,338,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබූ අතර, වැය විෂයන් 15 කට අදාලව රු.169,000,000 ක්වූ අධි ප්‍රතිපාදන මු.රෙ. 66/69 මඟින් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් හැකි තරම් අවම කර ගනිමින් මනා මූල්‍ය කළමණාකරණයක් පවත්වා ගැනීමට කටයුතු කරන බවද සඳහන් කරමි. | නිසි අධ්‍යනයක් මත ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. |
| **(ii)** | ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 25කට වඩා ඉතිරි වීම් පවතින අවස්ථා 21 ක් පැවතුණි. | ඒ ඒ කාර්යයේ ප්‍රමුඛතාවය හා අවශ්‍යතාවයන්ට අනුව ප්‍රතිපාදන මාරු කර දීම තුළින් ප්‍රතිපාදන තුලනය කර ගනු ලබන අතර මෙම අභ්‍යන්තර පාලන ක්‍රමවේදය තුල ප්‍රතිපාදන ඉතිරිවීම්, ඉක්මවීම් පැවතිය හැකි නමුත් භාණ්ඩාගාර වැය ශීර්ෂ අංක අනුව (Treasury Code) ප්‍රතිපාදන ඉක්මවා යාමට හෝ අනවශ්‍ය ඉතිරිවීම් ඇති නොවන ආකාරයට කටයුතු කරන බව කාරුණිකව පෙන්වා දෙමි. | නිසි අධ්‍යනයක් මත ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. |
| **(iii)** | මුල් ප්‍රතිපාදනයෙන් සියයට 23 ත් සියයට 387 ත් අතර ප්‍රමාණයකින් වැය විෂයයන් 06 ක් සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු වූ බවට එකඟ වෙමි. 2022 වර්ෂයේ ඉන්ධන හා ලිහිසි තෙල් වල මිල විශාල වශයෙන් ඉහළ යාම නිසා වැය ඇස්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන | නිසි අධ්‍යනයක් මත ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන ඇස්තමේන්තු සකස් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | ප්‍රමාණවත් නොවීය. එම නිසා 306-2-3-0-1202 හා 306-2-4-0-1202 වැය විෂයන් යටතේ වියදම් දැරීමට මෙන්ම 306-2-4-39-2101(12) හා 306-2-4-39-2104(12) වැය විෂයන් සඳහා වැය ඇස්තමේන්තුව මඟින් ඉල්ලුම් කරන ලද ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තුව තුලින් නොලැබීම නිසා අමතර ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. | |

**2.3 අධිවැය.**

පහත සඳහන් අධිවැය අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයන් 14 ක් සඳහා රු.30,536,215 ක ප්‍රතිපාදන ඉක්මවා වියදම් සිදු කර තිබුණි. | ඔබ විසින් විගණනයෙන් පෙන්වා දී ඇත්තේ පෙර සඳහන් කළ පරිදි දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර මූල්‍ය පහසුව සඳහා බෙදා ඇති ඒ ඒ උප දෙපාර්තමේන්තු වල උප වැය විෂයන්හි අධිවැය විස්තර වේ. ඇස්තමේන්තු සකස් කිරීම 100%ක් නිවැරදිතාවයකින් යුක්තව සිදු කිරීම කළ නොහැකි නිසා ඇතැම් උප වැය විෂයන්හි ප්‍රතිපාදන ඉක්මවීම සිදු විය හැකිය. නමුත් ප්‍රතිපාදන කලමනාකරණය කර ගැනීම තුලින් භාණ්ඩාගාර වැය විෂයන් (Treasury Code) ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමක් සිදු වී නැති බව සඳහන් කරමි. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් හැකි තරම් අවම කර ගනිමින් මනා මූල්‍ය කලමනාකරණයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව ද සඳහන් කරමි. | අනුමත ප්‍රතිපාදන සීමාවේ පමණක් වියදම් සිදු කළ යුතුවේ. |

**2.4 බලය නොලත් කාරක පාඩු.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගබඩා අත්තිකාරම් ගිණුමේ රු.මිලියන 13 ක කාරක පාඩුවක් දක්වා තිබුණු අතර මේ දක්වා එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනය දක්වා ඇති කරුණුවලට එකඟ වෙමි මේ සම්බන්ධයෙන් නොපමාව කටයුතු කර නිරවුල් කිරීමට ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. 1991-1993 කාල පරිච්ඡේදයේ වෙන්දේසියේදී සිදු වූ රු. 13,829,758 ක පාඩුව පෙර වර්ෂවල සිට දිගින් දිගටම පැවත | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ කාරක පාඩු පියවා ගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | එන්නක් වන අතර කපා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් මේ වන තෙක් ගිණුම් අංශය දැනුවත් කර නොමැති බැවින් එය ගිණුම්වල ගැලපීම් කිරීමට නොහැකිවී ඇත. | |

**2.5** **බැරකම් හා බැදීම්වලට එළඹීම.**

බැරකම් හා බැදීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය පරිදි ගිණුමේ ඇමුණුම් අංක (iii) යටතේ 2022/12/31 දිනට සියලුම බැදීම් හා බැරකම් අංක අනුව හෙළිදරව් කළ යුතු වුවත් දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු 03 කට අදාලව රු.1,532,473,670 ක් වටිනා බැදීම් හා බැරකම් ගිණුම් තුළ හෙළිදරව් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 අනුව සිගාස් වැඩසටහනට ඇතුළත් කළ බැරකම් මූල්‍ය ප්‍රකාශනවලටද ඇතුළත් කළ යුතුය. එසේ ඇතුළත් කිරීමට බැරකමට අදාළ වැය විෂයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබිය යුතුය. නමුත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය අනුව මහජන සේවය පවත්වාගෙන යෑමට ඇතැම් අවස්ථාවලදී හදිසි හා අත්‍යාවශ්‍ය මිල දී ගැනීම් සිදු කළ යුතුව ඇත. මේ හේතුව නිසා ඇතැම් බැරකම් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට ප්රමාණවත් ප්‍රතිපාදන නොමැති තත්ත්වයන් උද්ගත වේ. එවැනි බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී නැත. එම නිසා මෙම බැරකම් සම්බන්ධව මහාභාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලයිස්තුවක් වශයෙන් හෝ ඇතුළත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ආ)** | එක් එක් උප දෙපාර්තමේන්තුවේ 2022/12/31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් හා බැදීම් භාණ්ඩාගාරයේ SA92 දරණ සමුච්චිත බැරකම් වාර්තාවේ සඳහන් වටිනාකමට සමාන විය යුතු වුවත් එම ශේෂයන් අතර රු. 860,174,198 ක වෙනසක් නිරූපණය කෙරුණි. | අමතර කොටස් අවශ්‍යතාවයට සේවා/මෙහෙයුම් කටයුතුවලට බාධාවක් නොවන පරිදි සැපයීම සඳහා බැරකම් මගින් කළමනාකරණය කිරීමට සිදු වේ. ඉදිරියේ දී ප්‍රතිපාදන නොමැති බැරකම් වාර්තාවක් මගින් අවසාන ගිණුම්වල එළිදරව් කිරීමට උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | භාණ්ඩාගාරයේ සමුච්චිත බැරකම් ප්‍රකාශයේ දැක්වෙන බැරකම් මූල්‍ය ප්‍රකාශන වල බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබිය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාරයේ SA92 දරණ සමුච්චිත බැරකම් වාර්තාවේ ප්‍රධාන ඉංජිනේරු ධාවන බල, සංඥා හා සන්නිවේදන, ප්‍රවාහන අධිකාරි (කොළඹ) යන උපදෙපාර්තමේන්තු වල බැරකම් ශේෂය ලෙස පෙන්වා ඇති රු.40,686,052.67 ක ශේෂය තහවුරු කර ගැනීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තු බැරකම් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | බැරකම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ බැරකම් ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |
| (ඈ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව (සැපයීම් හා සේවා නොවන) ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැදි සිටිය යුතු වුවද, සමාලොචිත වර්ෂය තුල දී සිදුකරන ලද නියැදි පරික්ෂාවේ දී වැය විෂයයන් 07 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු.306,637,665 ක බැරකම් වලට එළඹ තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**(ඉ) අසම්භාව්‍ය බැරකම්.**

| | | |
|---|---|---|
| දුම්රිය දෙපාර්තමේන්තුවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 39 ක් පවරා තිබූ අතර ඒ පිළිබඳ හෙළිදරව් කිරීම් අවසාන ගිණුම් තුළ කර නොතිබුණි. | බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධව අසම්භාව්‍ය බැරකම් ඉදිරි වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කරගෙන ඇති බව කාරුණික දන්වා සිටිමි. | අනාවරණය කිරීම් සිදු කළ යුතුවේ. |

## 2.6 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුම්රිය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් සිදු කර එහි ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වුවත් පද්ධතියේ සඵලදායි තාවය පිළිබඳ සමාලෝචනය සිදු කර ඒ පිළිබඳ වාර්තා ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දී කලින් කලට සමාලෝචනය කළ යුතුවේ. |

ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i)** | මුදල් රෙගුලාසි 104 (1) (අ) | නානුඔය ස්ථිරමාර්ග බල ප්‍රදේශය තුළ ස්ථිරමාර්ග පරීක්ෂක යටතේ ඇති මාර්ග කොටස් වලට හා දුම්රිය දේපල වලට සිදුව ඇති හානි 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව ක්‍රියාකර නොමැති අතර ඒවායේ හානි නිසි පරිදි තක්සේරු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | මුදල් රෙගුලාසි 128(2) (ඇ) විධිවිධාන ප්‍රකාරව සහ 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය | නියම කර ඇති හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා එම කාල සීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන මාසය ඇතුලත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත විගණකාධිපතිට පිටපතක් සහිතව ඉදිරිපත් කල යුතු වූවත් 2022 වර්ෂයේ අර්ධ වාර්ෂික වාර්තා 2023 මාර්තු 27 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නියම කර ඇති දිනට අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තාව අතපසුවීමකින් ඉදිරිපත් කළ නොහැකි වූ අතර 2023 මැයි මස දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(iii)** | මු.රෙ 175 (2) | හිඟ මුදල් සම්බන්ධයෙන් අප්‍රමාදව නීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නීති මාර්ගයෙන් හෝ හිඟ මුදල් අය කර ගත නොහැකි නම් දීර්ඝ කාලීන හිඟ මුදල් භාණ්ඩාගාරයේ එකඟතාවය මත කපා හැරීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | **ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා කාර්ය සංග්‍රහය** | | | |
| **(i)** | 6.3.3 වගන්තිය | ප්‍රසම්පාදන කමිටුවේ එකඟත්වය සහිතව පත්කළ කමිටුවක් විසින් ලංසු විවෘත කිරීම කළ යුතු වුවද M6 Class හා S8 Class Locos සඳහා අමතර කොටස් මිලදී ගැනීමේදී එසේ ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත්කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | 6.3.6 වගන්තිය | ලංසු විවෘත කිරීමේ කටයුතු ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 6.3.6 හි දක්වා ඇති පරිදි වූ නියමිත ආකෘති පත්‍රයක සටහන් කර විවෘත කිරීමේ කමිටුවේ සියළු සාමාජිකයන් විසින් අත්සන් කළ යුතු වුවද M6 Class හා S8 Class Locos සඳහා අමතර කොටස් මිලදී ගැනීමේදී එවැනි කිසිදු ආකෘතියක් භාවිතා කර නොතිබූ අතර මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයේ නම හා ඉදිරිපත් කර ඇති මිල පමණක් දක්වා පැමිණි නිලධාරීන් විසින් අත්සන් කළ ලියවිල්ලක් ලිපි ගොනුවේ දක්වා තිබුණි. | වර්තමානයේ (2018 වර්ෂයේ සිට) විධිමත් පරිදි වගන්තිය අනුව විවෘත කිරීමේ කමිටුව ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(iii)** | 8.9.1. (ආ) වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව රු.500,000 ක් ඉක්ම වන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා ලිඛිත කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද ලිපිගොනු අංක RTS/3095/11 මඟින් අමතර කොටස් මිළදි ගැනීමේදි සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | විගණිත ලිපිගොනු අංක RTS 3095/11 මඟින් අමතර කොටස් මිළදි ගැනීමේදි සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර නොමැති බව පිළිගන්නා අතර වර්තමානයේදී රු.500,000.00 අගය ඉක්ම යන මෙම අංශයේ සෑම ප්‍රසම්පාදනයන් සඳහාම විධිමත්ව අත්සන් කරන ලද ලිඛිත ගිවිසුමක් හරහා භාණ්ඩ හා සේවා මිලදී ගන්නා බව දන්වනු කැමැත්තෙමි.<br>ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ අංක 7.4 අනුව ලංසුවේ වලංගු කාල සීමාවෙන් සියයට 50ක කාලයක් ඇතුළත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් වාර්තාව ලබා දිය යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(iv)** | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ අංක 7.4 අනුව ලංසුවේ වලංගු කාල සීමාවෙන් සියයට 50 ක කාලයක් ඇතුළත තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් වාර්තාව ලබා දිය යුතුය. | **(a)** අංකRLJ 3211/11 ප්‍රසම්පාදනය සඳහා වූ වාර්තාව ලබා දීමට දින 187 ක් ගතවී තිබුණි.<br>**(b)** අංක SRS(C) RWS 3367/15 ප්‍රසම්පාදනය සඳහා වූ වාර්තාව ලබා දීමට දින 169 ක් ගතවී තිබුණි.<br>**(c)** SRS(C)RTS 3095/11 ප්‍රසම්පාදනයට අනුව දින 330 කට පසුව 2012 මැයි 19 දින තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබා දී තිබුණි. | (a) (b) ( c) - තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා හැකි සෑම අවස්ථාවකදීම ඉතාමත් කඩිනමින් ලබාදීමටත් නොවැලැක්විය හැකි කරුණු හේතුවෙන් ප්‍රමාද වන්නේනම් එම පැහැදිලි කිරීම්ද සහිතව වාර්තා ඉදිරිපත් කරන ලෙසත් තාක්ෂණික ඇගයීම් කමිටු වෙත දුම්රිය සාමාන්‍යාධිකාරි මගින් උපදෙස් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.<br>මෙය ඉදිරියේදී සිදුවීම වැළැක්වීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව අවශ්‍ය කරන කාර්යාලීය වෙනස්වීම් සිදුකර ඇති අතර ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ Earnest & Young | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ආයතනය මගින් සිදුකරන අධ්‍යනයට අනුව භාණ්ඩ ඉල්ලුම් කිරීම තොගගත කිරීම හා තොග කළමණාකරණය සඳහා පරිගණකගත වැඩපිළිවෙලක් මෙම වසර අවසානයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇත. | |
| (ඈ) | දුම්රිය දෙපාර්තමේන්තු පොදු රෙගුලාසි සංග්‍රහයේ 03 වන ඡේදයේ 5.5 සහ 5.6 උප වගන්ති | මාසයකට පසු හිමිකම් නොපෑ පාර්සල්, හිමිකම් නොපෑ පාර්සල් ලේඛණයට මාරු කර ඒ බව ප්‍රධාන ගණකාධිකාරී වෙත දැන්විය යුතු නමුත් එසේ පියවර නොගෙන තිබුණු අවස්ථා විය. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | දුම්රිය දෙපාර්තමේන්තු පොදු රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | දුම්රිය ආඥා පනතේ 200 අධිකාරියේ 31(අ), 31(ආ), 31(ඇ), 31(ඈ) වගන්ති | දුම්රිය සාමාන්‍යාධිකාරිගේ ලිඛිත අවසරයකින් තොරව දුම්රිය රක්ෂිතයන් තුළ කිසිදු කටයුත්තක් සිදු කළ නොහැකි වුවද වැලිගම දුම්රිය ස්ථානය අතර දුම්රිය රක්ෂිතයේ අනවසරයෙන් ගොඩනැගිලි ඉදිකර ගෙන තිබුණු බවත්, තවත් පිරිසක් විසින් එම රක්ෂිත ඉඩම් අත්පත් කරගෙන වෙළඳාම් කටයුතු සිදු කර ගෙන යනු ලබන බව නිරීක්ෂණය වූ අතර ඒ බව දුම්රිය සාමාන්‍යාධිකාරීට දන්වා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු ඉටු කර නොතිබුණි. මෙම අනවසර ඉදි කිරීම් තුළ ස්ථිර කඩකාමර 13 ක් පිහිටා තිබූ බැවින්, ඒ සඳහා ජල, විදුලිය පවා ලබා ගෙන අදාළ පලාත් පාලන ආයතනය මගින් ව්‍යාපාරික බලපත්‍ර ද ලබා ගෙන තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | දුම්රිය ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**2.8 අවිධිමත් ගනුදෙනු.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, එසේ කිසිදු සහතිකවීමකින් තොරව සැපයුම්කරු හට මුදල් ගෙවීම හේතුවෙන් සපයා නොමැති භාණ්ඩ සඳහා රු. 95,763,117 ක් ගෙවා තිබුණි. | නමුත් මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි , සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමටත් (නිසි කලට භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම, සැපයීම ප්‍රමාදවීම, අඩුවෙන් සැපයීම, තොග හානි, පිරිවිතරයන්ට අනුකූල නොවන තොග ආදී කරුණු සම්බන්ධයෙන් ගතහැකි ක්‍රියාමාර්ග ඇතුළත් වන පරිදි) ලේඛන සැකසීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින් මේ වන විට අදාළ ලංසු ලේඛන කෙටුම්පත් කර ඇති අතර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මෙම තත්වය බොහෝ දුරට අවම කරගත හැකි බව දන්වමි.<br><br>මීට අමතරව දැනට නොසැපයූ භාණ්ඩ සඳහා කර ඇති ගෙවීම් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා ප්‍රසම්පාදන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විෂය ලිපිකරුවන් දෙදෙනෙක් පත් කර මාස 06 ක් ඇතුළත මෙම කටයුතු අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව විධිමත් අධිකාරී බලයක් යටතේ ගෙවීම් සිදු කල යුතුවේ. |
| (ආ) | Item No:18 සහ 19 යටතේ MS MTU Asia Pvt ආයතනයෙන් ඇණවුම් කළ රු.5,451,181 ක් වූ (Euro 31,586.40 × 172.58) අමතර කොටස් 180 ක් ලැබී නොතිබූ අතර මෙම අමතර කොටස් 2013 මැයි 21 දින CFS – 1 Ware House එකෙහි ඇතිවූ ගින්නෙන් විනාශ වූ බවට ලිපිගොනුවෙහි තොරතුරු දක්වා නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කර තිබුණි. එහෙත් ගබඩා අත්තිකාරම් ගිණුමෙහි | විගණනය විසින් පෙන්වා දෙන අයිතම අංක 18 හා 19 අදාළ සැපයුම් කරු විසින් නැව්ගත කර ඇති බව ලිපිගොනුව අනුව පැහැදිලි වන අතර, නිෂ්කාශනය කරන අවස්ථාවේදී එම අයිතම අඩංගු ඇසුරුම (Box) නොතිබූ බව වාජ්පු අංශය වාර්තා කර ඇත. ඒ අනුව එම අයිතම 2013.05.21 දින වරාය ගුදමේ ඇතිවූ ගින්නෙන් විනාශ වූ භාණ්ඩ සේ සලකා නැවත ඇණවුම් කිරීමට කටයුතු කර ඇති බව පෙනී යයි.<br><br>ලිපිගොනුව අනුව මෙම ඇණවුමට අදාල අයිතම ඇසුරුම් 02 ක නැව්ගත කර ඇති අතර නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු ගේ 2013.11.18 ලිපියේ 3095/11 ඉන්වෙන්ටුවට අදාල ඇසුරුම (Box) ගින්නෙන් හානි වී නොමැති බව දන්වා ඇතත් ඇසුරුම් ගණන කොපමණද යන්න සඳහන් කර නැත.<br><br>ඒ අනුව නැවත ඇණවුම් කර ඇත්තේ වරාය ගුදමේ ඇතිවූ ගින්නෙන් විනාශ වූ භාණ්ඩ බව කාරුණිකව දන්වමි.<br><br>RTS 3095/11 ලිපි ගොනුවට අදාලව අංක 230 of 27/05/2014 භාණ්ඩ ලැබීම් පත දුම්රිය ගබඩා උපදෙපොර්තමේන්තු ගිණුම් අංශය වෙත 2014 අගෝස්තු | වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියා කළ යුතුවේ. මෙම සිදුවීමේදී රජයට වූ අලාභයට හා පරිපාලන අකාර්යක්ෂමතාවය හා විෂමාචාරයන් සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම සිදු කළ යුතුවේ. |

ගින්නෙන් විනාශ වූ තොග වටිනාකම ලෙස දක්වා තිබූ ශේෂය තුළ මෙම අයිතමයන් නොවූ අතර රු. 5,451,181 ක් වූ මෙම අමතර කොටස් වල වටිනාකම නොලැබූ භාණ්ඩ ලෙස 2022 ගබඩා අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබුණි. එමෙන්ම මෙමගින් මිලදී ගත් භාණ්ඩ (Boxes) සොයා ගත් බවත් ඒවා විනාශ වී නොමැති බවත් සාමාන්‍ය ක්‍රමවේදය මත ඒවා නිදහස් කර ගත හැකි බවත් 2013 නොවැම්බර් 18 දිනැතිව DME විසින් SRS වෙත යොමු කළ ලිපියෙන් සඳහන් කර තිබුණි. මේ අනුව මුදල් ගෙවා ඇතත් සැපයුම්කරු විසින් සපයා ඇත්ද යන්න තහවුරු නොවූ රු. 5,451,181 ක් වූ මෙම භාණ්ඩ ගින්නෙන් විනාශ වූ ලෙස ලියවිලි ඉදිරිපත් කර එම භාණ්ඩ නැවත ඇණවුම් කිරීමට කටයුතු කර ඇත්ද යන්න පිළිබඳව ගැටළුවක් පැන නැගී තිබුණි.

මස ලැබී 2014 සැප්තැම්බර් මස ගිණුම්ගත කර ඇත.

තවද එම භාණ්ඩ ලැබීම් පතෙහි පහත අයිතම දෙක නොසැපයූ භාණ්ඩ (Short item) ලෙස සඳහන් කර ඇත. එම නිසා ගබඩා අත්තිකාරම් ගිණුම යටතේ නොසැපයූ භාණ්ඩ ලෙස 2014 සිට මේ දක්වා වාර්තා කර ඇත. එම භාණ්ඩ නැවත ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් වසරක් පසු ලිපි මගින් අදාල අංශ දැනුවත් කර ඇත.

| Item name | Part No | Quantity | Amount (EURO) | Amount (LKR) (LC, Custom & Landing) |
|---|---|---|---|---|
| 1) Bearing Main /0-0/UP /RIL/ | 5240336101 | 90 | 13,335.30 | 2,287,082.68 |
| 2) Bearing Main /0-0/LO /SPT | 5240336602 | 90 | 18,251.10 | 3,175,464.16 |
| | | 180 | 31,586.40 | 5,462,546.84 |

**2.9 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 ප්‍රකාරව සංශෝධිත මු.රෙ. 371(2) (ආ) ඡේදය අනුව ‘‘තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම එම තත්කාර්යය අතුරු අග්‍රිමය පියවිය යුතුය’’ සහ මු.රෙ. 371 (5) අනුව ‘‘අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිම නැවත පියවිය යුතුය’’ ලෙස විධිවිධාන සලසා තිබුණත් රු.5,052,005 ක් වූ අතුරු අග්‍රිම සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම දින 10 ක් තුළ පියවිය යුතු නමුත්, එසේ පියවීම නොකිරීම සම්බන්ධව උපදෙපාර්තමේන්තු වෙත දැනුවත් කිරීමටත් එය නියමිත පරිදි පියවීමට අවශ්‍ය කටයුතු කිරීමටත් පියවර ගනිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අතුරු අග්‍රිම නියමිත කාල සීමාව තුළ පියවිය යුතුවේ. |

**2.10 බැංකු ගිණුම් මෙහෙයවීම.**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 1761001 2902 7313 දරණ බැංකු ගිණුමෙහි රු.271,163 ක් වූ චෙක්පත් 07 ක් අගරු වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොතිබුණි. | මෙම චෙක් පත් 07 නිරවුල් කිරීම සඳහා එවන ලද චෙක්පත් නැවත ප්‍රමාද දෝෂයකින් ආදායමට බැර වීම නිසා ද්විගණන දෝෂයක් සිදුවී ඇති බැවින් 2023 ජූනි මස දී එම දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කාර්යසාධනය.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාලසටහනකට අනුව දුම්රිය ධාවනය ආරම්භ වූයේ 1865 දී වුවද මේ දක්වා කාල සටහන් අනුව දුම්රිය ධාවනය නොවන බවට දුම්රිය භාවිතා කරන්නන්ගෙන් පැමිණිලි ලැබී තිබුණි. 2022 දී සැලසුම් කල දුම්රිය | පිළිතුරු ලබා දී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවරට අනුව කටයුතු කර තිරසර සංවර්ධන ඉලක්ක ළඟා වන පරිදි දුම්රිය |

| | | | |
|---|---|---|---|
| | ධාවන වාර සංඛ්‍යාව 120,993 ක් වූ අතර ඒ තුළින් නිශ්චිත වේලාවට ධාවනය වී තිබූ දුම්රිය වාර ගණන 32,844 ක් විය. අවලංගු වී තිබූ දුම්රිය වාර ගණන 10,077 ක් වී තිබුණි. ඒ අනුව 72% දුම්රිය නියමිත පරිදි ධාවනය වී නොතිබුණි.<br><br>2022 වර්ෂයේදී දුම්රිය එන්ජින් 23 ක් හා බලවේග කට්ටල 36 ක් ඌණ උපයෝජිතව පැවතුණ ද 2021 දි ඉන්දියාවෙන් බලවේග කට්ටල 06 ක් හා එන්ජින් 10 ක් ඇමරිකානු ඩොලර් මිලියන 90 ක් ගෙවා ලබා ගෙන තිබුණි. දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ සමස්ත මගී ප්‍රවාහනයෙන් 6% ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් 6.5% ක් දායකත්වයක් ලබා දෙන දුම්රිය සේවය එකී දායකත්වය ඉහළ නංවා ගැනීමට අපොහොසත් වී තිබූ අතර 1934 දි දුම්රිය මාර්ගස්ත ජාලය කිලෝමීටර් 1521 ක් වුවද 2021 වන විට එය කිලෝ මීටර් 1465 ක් දක්වා කිලෝ මීටර් 56 කින් අඩු වී තිබුණි. එම අඩුවීම බෙලි අත්ත දක්වා වූ කිලෝ මීටර් 32 ක් ද අලුතින් එක් කල පසුව වී තිබුණි. | | කාර්යසාධනය පාරිභෝගිකයින්ට සමීප වන ආකාරයෙන් වර්ධනය කළ යුතුවේ. |
| (ආ) | අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග වල ආරක්ෂාව සඳහා සීනු හා විදුලි පද්ධති 200 ක් ස්ථාපනය කිරීම. | | |
| | • ගිවිසුම් ප්‍රකාරව 2017 ජනවාරි 27 වන විට මාර්ග ආරක්ෂණ පද්ධති 200 නිමකර භාරදිය යුතු වුවද 2022 අගෝස්තු 01 වන විට පද්ධති 200 ම ඉදිකර තිබුණද එයින් 10 ක් නිසි පරිදි අත්හදා බැලීම් සිදු කර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදී නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව අනුව වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු පද්ධති අළුත්වැඩියා කටයුතු සිදුකළ යුතු අතර වගකීම් කාලයෙන් පසුව පද්ධති අළුත්වැඩියා කිරීමේ කටයුතු ප්‍රධාන ඉංජිනේරු සංඥා හා විදුලි උපදෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ඇත. ස්ථාපනය කර ඇති සීනු හා විදුලි පද්ධති ක්‍රියාවිරහිත වීම පිළිබඳව තොරතුරු ප්‍රධාන ඉංජිනේරු සංඥා හා විදුලි උපදෙපාර්තමේන්තුව වෙත වාර්තා වන අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු එම උපදෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධව පියවර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | • 2022 අගෝස්තු වන විට කොන්ත්‍රාත් මුදලින් 95% ක් වූ රු.1,003,446,336 ක් ගෙවීම් කර පැවතියද සවි කර වසරක් ගත වීමටත් ප්‍රථම පහල මාර්ගයේ සවිකළ සීනු හා විදුලි පද්ධති 142 න් 60 ක් හා පුත්තලම් මාර්ගයේ සවිකළ සීනු හා විදුලි පද්ධති 46 න් 34 ක් වශයෙන් සමස්තව සීනු හා විදුලි පද්ධති 94 ක් ක්‍රියා විරහිතව පැවතුණි. මේ අනුව සවිකර ඇති සීනු හා විදුලි පද්ධති වලින් 50% කට ආසන්න ප්‍රමාණයක් අක්‍රිය වීම මත ඒ සඳහා වැය කර ඇති රු. මිලියන 500 කට ආසන්න වියදම නිශ්කාර්ය වියදමක් වී තිබූ අතර මෙම අක්‍රිය සීනු හා විදුලි පද්ධති හේතුවෙන් අනුමත දුම්රිය හරස් මාර්ග වල ගමන් කළ පුද්ගලයින් හා රථ වාහන දුම්රිය සමඟ ගැටී අනතුරු රාශියක් සමාලෝචිත වර්ෂයේදී වාර්තා වී තිබුණි. මේ තත්ත්වය පාදකව දුම්රිය හරස් මාර්ග භාවිතා කරන අයගේ ජීවිත හා දේපළ වලට දැඩි අනාරක්ෂිත තත්ත්වයක් ඇති වී තිබුණද ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | 2022 අගෝස්තු වන විට කොන්ත්‍රාත් මුදලින් 95% ක් ගෙවීම් කර නොමැති අතර ගෙවා ඇත්තේ කොන්ත්‍රාත් මුදලින් 79%කි. එනම් ඇ.ඩො. 5,130,659.10කි (රු.801,649,056.41) තව ද අවසාන පද්ධති 10 සඳහා කිසිදු මුදලක් ගෙවීම් කර නැත.<br>• ඉහත දෝෂ සහිත පද්ධති 94 සඳහා ගංවතුරින් හා හදිසි අනතුරුවලින් විනාශ වූ පද්ධති 20ක් ද ඇතුළත් ය. ඒ අනුව දෝෂ සහිත පද්ධති, භාවිතයේ පවතින පද්ධතිවලින් 74කි. එම දෝෂ සහිත පද්ධති 2023 මැයි වන විට 74 සිට 27 දක්වා අඩු වී ඇත. දීර්ඝ විදුලි කප්පාදුව නිසා බැටරි හානි වීම මත සිදු වූ දෝෂ වූ අතර ඒ අතරින් විශාල සංඛ්‍යාවක් නිවැරදි කර ඇත. ඉතිරි දෝෂ වූ පද්ධතිවල විද්‍යුත් උපාංග ඇණවුම් කර ඇත. එම උපකරණ ලැබූ පසු ඉතිරි දෝෂ වූ පද්ධති නිවැරදි කළ හැක. මෙයට අමතරව දීර්ඝ කාලීනව සැලසුම් ලෙස<br>**1.** මධ්‍යගත මෙහෙයුම් පද්ධතියක් (Centralized Controlled System) මිල දී ගැනීම සඳහා කටයුතු යොදා ඇත.<br>**2.** අධික මෙහෙයුම් පද්ධති ප්‍රමාණය නිසා නඩත්තු කටයුතු සංඥා හා විදුලි ඉංජිනේරු උපදෙපාර්තමේන්තුවට කර ගෙන යෑමට අපහසු බැවින් තුන්වන පාර්ශ්වයක් වෙතින් නඩත්තු සේවා ලබා ගැනීම සඳහා සැලසුම් කර ඇත. | අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු ඉටු නොවීම සම්බන්ධව විමර්ශනයක් සිදු කර අවශ්‍ය පියවර ගත යුතුවේ. |
| (ඇ) | අඹේපුස්ස ගල්කොරියේ මාසික සාමාන්‍ය නිෂ්පාදන ප්‍රමාණය කියුබ් 1000 ක් වුවත් 2022 වර්ෂයේ ජනවාරි සහ නොවැම්බර් යන මාස වලදී පමණක් කළුගල් කියුබ් 600 කට වඩා නිෂ්පාදනය කර තිබූ අතර, අනෙක් මාස 08 තුළදීම අදාළ ඉලක්ක ගත කියුබ් ප්‍රමාණයෙන් ¼ කටත් වඩා අඩු අගයක් නිෂ්පාදනය කර තිබුණි. තවද | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | අපේක්ෂිත නිෂ්පාදන ධාරිතාවය කරා ළඟා වීමට හේතු පරීක්ෂා කර ඊට පිළියම් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | 2022 මැයි මස 23 වන දින සිට 2022 ජූනි මස 23 වන දින දක්වා වූ මාසය තුළ කිසිදු නිෂ්පාදනයක් සිදු කර නොතිබුණි. | | |
| **(ඇ)** | ගෙලිඔය දුම්රිය පොල අසල ගේබියන් බැම්මක් ඉදි කිරීමේදී පැවති බැම්ම පැවති ප්‍රමාණයෙන්ම ඉදි කිරීම සිදු කරනු ලබන්නේ නම්, ඒ සඳහා අමතරව කළුගල් අවශ්‍ය නොවන නමුත්, ගබඩාව හරහා මෙම වැඩබිමට කළුගල් කියුබ් 20 ක් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය. කළුගල් ප්‍රමාණය වැඩි වීමට නම්, නව සැලැස්මක් මත එය සිදු කළ යුතුව පැවතියද, පරීක්ෂණ දිනය වූ 2022 ජූනි 28 දින තෙක් එසේ නව සැලැස්මක් අනුමත කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කිරීමේදී ඒවායේ අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන පමණක් නිකුත් කළ යුතුවේ. |
| **(ඉ)** | මහනුවර ගැටඹේ ද්විත්ව මාර්ගය දෙපස කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) විසින් 2021 අගෝස්තු මස සකස් කර තිබූ අංක 22787 දරණ පැතිකාණු සැලැස්මට පිටින් මෙම කාණු පද්ධතිය ඉදි කරමින් පැවති අතර, එය නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු හා දිස්ත්‍රික් ඉංජිනේරු (ඉහළ) ගේ වාචික උපදෙස් මත, ලබා දී තිබුණු සැලසුමෙන් පිට ඉදි කිරීමක් බව අනාවරණය වී තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | අනුමත සැලැස්මට අනුව පමණක් ඉදිකිරීම් සිදු කළ යුතුවේ. |
| **(ඊ)** | ගාල්ල ස්ථිර මාර්ග බල ප්‍රදේශය තුළ පවතින දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව 75 ක් වන අතර එයින් පිහිටුවා ඇති (Bell and Light) සීනු හා විදුලි සහිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව 50 කි. එයින් (Bell and Light) සීනු හා විදුලි සහිත දුම්රිය හරස් මාර්ග 31 ක් අක්‍රීයව පැවතිණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | අවශ්‍ය නඩත්තු කිරීම් නිසි පරිදි සිදු කර ඒවායේ ප්‍රතිලාභ ලබා ගත යුතුවේ. |

**3.2 සැලැසුම් කිරීම.**

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ක්‍රියාකාරී සැලැස්ම.** 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව රජයේ ආයතන සෑම වර්ෂයක් වෙනුවෙන්ම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට ප්‍රථම සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කල යුතු වුවත් එම දිනයට සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. තවද එම චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් විය යුතු අනෙකුත් විස්තර හා ආකෘති ප්‍රකාර තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | දුම්රිය දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2023.01.06 වන දින ප්‍රවාහන අමාත්‍යාංශය වෙත භාරදුන් අතර, එය 2023.02.02 දින අනුමත කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ආ) පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම.** 2018 ජනවාරි 14 දිනැති අංක 05/2008(1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධීක්ෂණ කළමණාකරු (ගොඩනැගිලි) මහනුවර අංශයේ නඩත්තු වැඩ වෙනුවෙන් පිළියෙල කර තිබුණු වාර්ෂික සැලසුම් පරීක්ෂා කිරීමේදී සැලසුම් කරන ලද වැඩ 126 න් ඉතා සුළු නඩත්තු වැඩ කොටස් ප්‍රමාණයක් එනම් වැඩ 26 ක් පමණක් ඉටු කර තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | වාර්ෂික සැලැස්මට අනුකූල විය යුතුවේ. |

**3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.**

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙලිඔය දුම්රිය පොළ අසල ගේබියන් බැම්ම ඉදි කිරීමේදී ඒ අනුව ඉදිකර තිබූ දුර ප්‍රමාණයේද වෙනසක් නොතිබියදී, හා D Note මගින් පාවිච්චි කරන ලද ගේබියන් දැල් (box) නැවත ගබඩාව වෙත භාරදී නොතිබියදී, නව ගේබියන් දැල් (box) 23 ක් එනම් දිග මීටර් 40 ක් ගබඩාවෙන් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. කළුගල් කියුබ් 20 ක් හා ගේබියන් දැල් (box) 23 ක් සඳහා රු.681,700 ක නිශ්කාර්යය පිරිවැයක් දරා තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උප දෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ගබඩාවෙන් බඩු නිකුත් කිරීම නිසි අනුමැතීන් යටතේ සිදු කළ යුතු අතර නිසි වාර්තා පවත්වා ගෙන යා යුතුවේ. |

**3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අධීක්ෂණ කළමණාකරු (ගොඩනැගිලි) මහනුවර අංශයේ 2022 වර්ෂයේදී යෝජිත නව ව්‍යාපෘති 08 න් පරීක්ෂණ දිනය වූ 2022 ජූනි 28 දින වන විටත්, ආරම්භ කර තිබුණේ එක් යෝජනාවක් පමණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | යෝජිත ව්‍යාපෘති කාලීනව නිම කිරීමට කටයුතු කළ යුතුවේ. |
| **(ආ)** | ගාල්ල ගොඩනැගිලි අංශය මගින් 2021 වසර තුළ ඉටුකිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තු මුදල රු.40,600,000 ක් වූ නව යෝජනා 07 ක්ද, 2022 වසර තුළදී ඉටු කිරීමට යෝජිත නව යෝජනා 08 ක් ද ප්‍රතිපාදන නොමැති වීම මත ඉටු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | සැලසුම් කළ පරිදි නියමිත කාලය තුළ කාර්යයන් නිම කළ යුතුවේ. |

**3.6 වාර්ෂික කාර්යසාධන වාර්තාව.**

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමහ ඉදිරිපත් | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව | විගණන පනතේ හා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | කල යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | කාරුණිකව දන්වා සිටිමි. | |

**3.7 විදේශ ආධාර ව්‍යාපෘති.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | ඉන්දියානු ණය රේඛා ගිවිසුම යටතේ වූ ණය ආධාර අනුව මහව - අනුරාධපුර - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය. | | |
| **(i)** | ඉන්දියානු එක්සිම් (Exim) බැංකුව සමඟ එළඹි ණය ගිවිසුමේ කොන්දේසි වලට යටත්ව මහව - අනුරාධපුර - ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය අදියර 04 ක් යටතේ පිළිසකර කිරීම සඳහා ඉන්දීය රජයේ සමාගම් වලින් මිල ගණන් කැඳවා 2019 නොවැම්බර් 29 දින සිට මාස 36 කින් නිම කිරීම සඳහා 2019 ජූලි 18 දින Ircon International Limited ආයතනය සමඟ ඇමරිකානු ඩොලර් 91,268,600 කට ගිවිසුමකට එළඹ තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2022 නොවැම්බර් 28 වන විට මෙම ව්‍යාපෘතිය නිම කළ යුතු වුවද එදිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 35 ක පමණ දුර්වල මට්ටමක පැවතුණි. අනුරාධපුර - වවුනියා හා වවුනියා ඕමන්තේ මාර්ග කොටස ඉදිකිරීම් 2023 ජනවාරි සිට සිදු කරමින් පැවති අතර එම කොටසෙහි වැඩ මැයි මස අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. 2023 පෙබරවාරි වන විට මුළු ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 44 ක් පමණක් වූ අතර මහව- අනුරාධපුර මාර්ග කොටසෙහි ඉදි කිරීම් මෙතෙක් ආරම්භකර නොතිබූ බැවින් මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් 2023 වර්ෂයේදී ද නිම කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාවය ඉහල නංවා ගනිමින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත භෞතික හා මූල්‍ය ප්‍රගතිය ළඟා කරගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | IV වන අධියර (අනුරාධපුර සිට මිහින්තලේ හන්දිය දක්වා කොටස)<br>• ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම අනුරාධපුර සිට මිහින්තලේ හන්දිය දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගයේම දුම්රිය ධාවනය කර මිහින්තලේ හන්දිය සිට මිහින්තලේ දක්වා දැනටමත් ඉදි කර ඇති දුම්රිය මාර්ගය ඔස්සේ දුම්රිය ධාවනය කර තිබුණි. එසේ තිබියදී මෙම ව්‍යාපෘතියේ IV වන අධියර මඟින් අනුරාධපුර සිට මිහින්තලේ හන්දිය දක්වා ඇති කිලෝමීටර් 1.5 ක දුර ප්‍රමාණය සඳහා ප්‍රධාන දුම්රිය මාර්ගයට අමතරව වෙනම දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා US$ 672,784.74 කට ටෙන්ඩරය පිරිනමා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතීන් අනුමත කිරීමට හා ටෙන්ඩර් පිරිනැමීමට ප්‍රථම එහි ආර්ථික වාසි, අවාසි නිසි පරිදි ඇගයීම කළ යුතුවේ. |
| | • අනුරාධපුර සිට මිහින්තලේ දක්වා දුම්රිය ධාවනය පොසොන් කාලයට පමණක් වසරකට දින 3 ක් හෝ 4 ක් සිදුකරන අතර 2019 වර්ෂයෙන් පසුව දුම්රිය ධාවන සිදුකර නොතිබුණි. මේ අනුව අනුරාධපුර සිට මිහින්තලේ හන්දිය දක්වා කි.මී. 1.5 ක දුර ප්‍රමාණය ප්‍රධාන මාර්ගයේම දුම්රිය ධාවනය කර මිහින්තලේ හන්දියේදී මිහින්තලේ දක්වා පවතින දුම්රිය මාර්ගය ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කර මිහින්තලේ දක්වා දුම්රිය ධාවනය කළ හැකිව තිබියදී වසරකට දින 03 ක් හෝ 04 ක් දුම්රියක් ධාවනය කිරීම වෙනුවෙන් වෙනම මාර්ගයක් ඉදි කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ලබා ගන්නා විදේශ ණය මුදල් US$ 672,784 ක් එනම් රු. 222,018,720 (672,784 × 330) කට වැඩි මුදලක් වියදම් කිරීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතීන් අනුමත කිරීමට ප්‍රථම එහි ආර්ථික වාසි අවාසි නිසි පරිදි හඳුනාගත යුතු අතර ලබා ගන්නා ණය වඩාත් කාර්යක්ෂම, ඵලදායී හා අර්ථවත් අත්‍යවශ්‍ය ව්‍යාපෘතීන් වෙනුවෙන් යෙදවීමට පරිපාලනයේ අවධානය යොමු කළ යුතුවේ. |
| **(iii)** | • වර්තමානයේ දුම්රිය පීලිපැනීම් අඛණ්ඩව වාර්තා වන අතර මේ තුලින් සිදුවන දුම්රිය දේපළ අලාභයන් ඉහළ ගොස් ඇත. නව රේල් පාර ඉදි කිරීමේදී ගලවා ඉවත් කළ රේල් පීලි , අමතර කොටස් හා Sleepers දැනටමත් | පිළිතුරු සපයා නොමැත. | භාවිතයට ගත හැකි ද්‍රව්‍ය යොදා ගනිමින් අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු කඩිනමින් ඉටු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | රේල්පාර දුර්වල තත්ත්වයේ පවතින අනෙකුත් ස්ථාන වලට කඩිනමින් යැවීමේ අත්‍යාවශ්‍යතාවය කළමනාකරණයේ අවධානයට ලක්වී නොතිබුණි. | | |
| | • ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ගලවා ඉවත් කළ Sleepers හා අනිකුත් කොටස් වල සැලකිය යුතු ප්‍රමාණයකට හානි සිදු වී තිබූ අතර එම ද්‍රව්‍ය නැවත භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. වසර 10-25 ත් අතර පැවැත්මක් පවතින Sleepers අවම කාලයක් තුළ ගලවා ඉවත් කිරීම මුලින්ම තිබූ සැලසුම් වලට පටහැනිව ගත් ආර්ථික නොවන තීරණයක් බව නිරීක්ෂණය වන අතර පවතින රේල් පාරට සමාන්තරව නව රේල් පාරක් (ද්විත්ව මාර්ගයක් ලෙස) තැනීම ලෙස නව ව්‍යාපෘතිය සැලසුම් කළේ නම් වඩාත් ප්‍රතිඵලදායක බව විගණනයේ දී නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | පරිපාලනය විසින් ගන්නා තීරණ, ඉදිරිපත් කරන සැලසුම් වඩාත් ඵලදායී හා අර්ථවත් විය යුතු වන අතර ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතුවේ. |
| **(iv)** | දුම්රිය ප්‍රවාහනය ආකර්ශණීය, ලාභදායී, පරිසර හිතකාමී මෙන්ම ආරක්ෂිත ප්‍රවාහන මාධ්‍යයක් කිරීමේදී වර්තමානයේ ගන්නා තීරණ, සැලසුම් අනාගත ඉලක්ක සපුරාගත හැකි ආකාරයකට සිදුවිය යුතු අතර සථිර සාර නිර්ණායක නොමැතිව සිදු කරන ව්‍යාපෘති (මිලදී ගැනීම්/ඉදි කිරීම්) සැලසුම් තුලින් අනාගත ඉලක්ක දුරස්ථ කිරීමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | පරිපාලනය විසින් ගන්නා තීරණ, සැලසුම් අනාගතයේ ළඟා කරගත හැකි ස්ථිරසාර ඉලක්කයන් වෙනුවෙන් විය යුතුවේ. |
| **(ආ)** | කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක දුම්රිය මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා වූ ශක්‍යතා අධ්‍යයනය තුළින් ඉදිරි වසර 20 ක කාලය තුළ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ඇතුළත් ශක්‍යතා අධ්‍යයන වාර්තාව හා විස්තරාත්මක සැලසුම් 2021 වර්ෂයේ මාර්තු මස නිමකර අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. මෙම ශක්‍යතා අධ්‍යයනය සඳහා | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ශක්‍යතා අධ්‍යයනය ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ රු. 1,446,952,381 ක මුදලක් වැය කර තිබූ අතර එම ණය සඳහා වූ ණය වාරිකය වූ ඇමරිකානු ඩොලර් 275,000 බැගින් අර්ධ වාර්ෂිකව 2022 මාර්තු 15 සහ 2022 සැප්තැම්බර් 15 ගෙවීමට නියමිතව තිබුණි. නමුත් නිසි යෝග්‍යතා අධ්‍යනයක් සිදු කර අදාළ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මතුවන බාධක නිසි පරිදි හඳුනා නොගෙන අදාළ සැලැස්ම පිළියෙළ කිරීම නිසා උක්ත ශක්‍යතා අධ්‍යන ක්‍රියාත්මක නොකොට පැවතීම තුළින් ඒ සඳහා දැරූ මුදල් නිශ්කාර්ය වැයමක් වී තිබුණි. | | |
| **(ඇ)** | ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධානයන් (ගිවිසුම් අංක TA 9382 – SRI OF 29-10-2017) යටතේ ලද ඇමරිකන් ඩොලර් මිලියන 1.5 ක් වැය කර දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සකස් කළ ප්‍රධාන මෙහෙයුම් සැලැස්ම (Master Plan) ක්‍රියාත්මක කිරීමේදී මතුවන බාධක නිසි පරිදි හඳුනාගෙන නොතිබූ බැවින් එම සැලැස්ම මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.8 ප්‍රසම්පාදනයන්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | M4 – class locomotives සඳහා අමතර කොටස් මිලදී ගැනීමේදී අයිතම අංක 06 යටතේ මිළදී ගත් Panel model 17FL11C1 for over speed protection & Transition Speed Event අයිතමය නුසුදුසු තත්ත්වයේ පවතින බව 2019 අප්‍රේල් 02 වන දින සැපයුම්කරුට දෙවන වරටත් දන්වා තිබුණි. ඒ අනුව දෙවන වරටත් ප්‍රතික්ෂේප වූ මෙම අයිතමය සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 05 වැනි දින නැවත දන්වා යවා තිබූ අතර රු.1,202,864 (110.71×10,895) ක් වූ මෙම භාණ්ඩ 2022 දෙසැම්බර් 31 වන විටත් සපයා නොතිබුණි. | දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි, සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමටත්, ලේඛන සැකසීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින් මේ වන විට අදාළ ලංසු ලේඛන කෙටුම්පත් කර ඇති අතර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා | ගිවිසුම අනුව කටයුතු කළ යුතු අතරම මෙවැනි අවස්ථා සඳහා ප්‍රතිපාදන ශක්තිමත්ව ගිවිසුම් තුළ ඇතුළත් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | ගැනීමෙන් පසු ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මෙම තත්වය බොහෝ දුරට අවම කරගත හැකිය. | |
| **(ආ)** | M4 – class locomotives සඳහා අමතර කොටස් මිලදී ගැනීමේදී දෙවන වරටත් ප්‍රතික්ෂේප වූ අයිතම අංක 06 පිළිබඳව අදාල ආයතනය වෙත දන්වා යවන ලද අවස්ථාව වන විට එම අයිතමයේ වගකීම් කාලය අවසන් වී තිබූ අතර 2022 දෙසැම්බර් 31 වන විටත් එම ආයතනයෙන් මේ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. | දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි , සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමටත් ලේඛන සැකසීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. | එම ආයතනයට එරෙහිව පියවර ගත යුතුවේ. |
| **(ඇ)** | M4 – class locomotives සඳහා අමතර කොටස් මිලදී ගැනීම 2011 වර්ෂයේ ආරම්භ කළද 2022 වර්ෂය වන තුරුත් අදාළ භාණ්ඩ නොලැබීම තුළින් භාණ්ඩ අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි වී තිබූ අතර මේ මගින් අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ඇනවුම් කර තිබුණි. | මෙම අයිතමය M4 වර්ගයේ එන්ජින් නඩත්තු සඳහා අවශ්‍ය අමතර කොටසක් වන අතර RLJ 3158/16 යටතේ අයිතම නවයක් මිළදී ගන්නා ලදී. එම අයිතම සියල්ලම මේ වන විට අවශ්‍යතාවය මත ගබඩාවෙන් ලබාගෙන අළුත්වැඩියා කටයුතු සඳහා යොදාගෙන ඇත. එම නිසා මෙම අයිතමය අත්‍යාවශ්‍ය නොවන අයිතමයක් නොවන අතර අවශ්‍යතාවය සපුරා ගැනීමට යොදාගත නොහැකි වුයේ සැපයූ අයිතමය දෝෂ සහිත වීමක් ඊට අදාළව නිවැරදි අයිතමය සැපයුම්කරු විසින් මෙතෙක් නැවත නොසැපයීමත් නිසා වේ.<br><br>සැපයුම්කරු විසින් මේ වන විට භාණ්ඩ දෙවතාවක්ම ලබා දී ඇති අතර එම සාම්පල දෝෂ සහිත වන බැවින් සැපයුම්කරු විසින් නැවත එම භාණ්ඩ ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. ඔවුන් විසින් සපයනු ලැබූ පළමු අයිතමය නැවත ලබාදීම සඳහා බැංකු සුරක්ෂණයක් (Bank guarantee) ලබා දිය යුතු බවත් එය ලබා දීමෙන් පසු එම අයිතම ලබා දිය හැකි බවටත් අදාළ සැපයුම්කාර ආයතනය සමග සාකච්ඡා කර එකගතාවයකට පැමිණ තිබේ. තවද දෙවනුවට සපයනු ලැබූ අයිතමය සැපයුම්කාර ආයතනයට නැවත ලබා දීමට එකග වූ අතර එම අයිතම | නිවැරදි අවශ්‍යතාවය මත පමණක් භාණ්ඩ ඇනවුම් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | වෙනුවට ක්‍රියාකාරී තත්වයේ පවතින අයිතම ලබා දීමටද එම ආයතනය එකඟ වී ඇත. | |
| (ඇ) | දුම්රිය මැදිරි අලුත්වැඩියා කිරීම සඳහා ඉතා කඩිනම් අවශ්‍යතාවය ලෙස දක්වමින් මිලදී ගැනීමට කටයුතු කලද 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසාන වන තුරු මෙම මිලදී ගැනීම වසර 04 ක් තුල සිදුකර ගැනීමට නොහැකි වීම හා ගබඩා වල තොග නොමැති බව දන්වා තිබීම හේතුවෙන් අලුත්වැඩියා කටයුතු කෙසේ සිදු කරන ලද්දේ ද යන්න විගණනයට ගැටළු සහගත වීම හා කඩිනම් අවශ්‍යතා ලෙස දක්වමින් ඉතා විශාල මිලදී ගැනීම් වලට යොමු වීම සත්‍ය ලෙසම අවශ්‍යතාවය අනුව සිදුවන්නේද යන්න විගණනයේදී මතභේදාත්මක වී තිබුණි. | මෙම අයිතමය M4 වර්ගයේ එන්ජින් නඩත්තු සඳහා අවශ්‍ය අමතර කොටසක් වන අතර RLJ 3158/16 යටතේ අයිතම නවයක් මිළදී ගන්නා ලදී. එම අයිතම සියල්ලම මේ වන විට අවශ්‍යතාවය මත ගබඩාවෙන් ලබාගෙන අළුත්වැඩියා කටයුතු සඳහා යොදාගෙන ඇත. එම නිසා මෙම අයිතමය අත්‍යාවශ්‍ය නොවන අයිතමයක් නොවන අතර අවශ්‍යතාවය සපුරා ගැනීමට යොදාගත නොහැකි වුයේ සැපයූ අයිතමය දෝෂ සහිත වීමක් ඊට අදාළව නිවැරදි අයිතමය සැපයුම්කරු විසින් මෙතෙක් නැවත නොසැපයීමත් නිසා වේ. | මිලදී ගැනීම් සත්‍ය ලෙසම අවශ්‍යතාවය අනුව පමණක් විය යුතුවේ. |
| (ඉ) | RJFM/3432/17 යටතේ ඇණවුම් කළ අමතර කොටස් අඩුවෙන් එවා ඇති බවත්, ඒවා නැවත සපයන ලෙසත්, 2020 ඔක්තොබර් 19 දින සැපයුම්කරු දැනුවත් කර පැවතියද රු.4,780,740 ක් වූ හිඟ අමතර කොටස් සැපයීමට හෝ ඊට අදාල මුදල් ආපසු ගෙවීමට සැපයුම්කරු මේ දක්වා කටයුතු කර නොතිබුණි. මුදල් ගෙවා වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණද භාණ්ඩ අඩුවෙන් සැපයීම සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසි ඇතුළත් නොවීම, රැඳවුම් මුදල් තබා නොගැනීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ලබා නොගැනීම හේතුවෙන් භාණ්ඩ අඩුවෙන් සැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරුට එරෙහිව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි. ඉහත සියලු කරුණු අනුව නොසැපයූ භාණ්ඩ වෙනුවෙන් දරා තිබූ රු.5,631,510 ක මුදල රජයට සිදුවූ අලාභයක් බවට පත්ව තිබුණි. | වර්තමානයේ ණයවර ලිපි විවෘත කිරීමේ කොන්දේසි ප්‍රකාරව 100% සම්පූර්ණ මුදලම සැපයුම්කරු වෙත ගෙවීම් සිදු කළ යුතුය. නමුත් සපයා නොමැති භාණ්ඩ පිළිබඳව හඳුනාගත් අවස්ථාවේදීම අදාල සැපයුම්කරුවන් වෙත දන්වා ඒවා නැවත ගෙන්වා ගැනීමට හෝ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. නමුත් මෙම තත්වය අවම කර ගැනීම සඳහා දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි, සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | ප්‍රසම්පාදනයන් වලදී වැදගත් සියළු කොන්දේසි ගිවිසුම් ගත කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. මිලදී ගැනීමේ ක්‍රියාවලියේ පවතින දූර්වලතා නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදයන් නිසා සිදු වී ඇත්නම් සිදු වූ අලාභය සඳහා වගකීමට බැඳෙන නිලධාරීන්ට එදිරිව පියවර ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | RWS/3367/15 යටතේ ඇණවුම් කළ එහෙත් සපයා නොමැති හිඟ භාණ්ඩ සපයන ලෙස අවස්ථා 04 කදී සැපයුම්කරු වෙත දැනුම් දී තිබුණ ද විගණන අවස්ථාව වූ 2022 ජූලි 15 වන විටත්, රු.3,697,022 ක් වූ හිඟ භාණ්ඩ සැපයීමට හෝ ඊට අදාළව මුදල් ආපසු ගෙවීමට සැපයුම්කරු කටයුතු කර නොතිබුණි. භාණ්ඩ කොටසක් සපයා වසර 03 කට වැඩි කාලයක් ගතවී තිබුණ ද භාණ්ඩ අඩුවෙන් සැපයීම සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසි ඇතුලත් නොවීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ලබා නොගැනීම හේතුවෙන් සැපයුම්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි. ඉහත සියලු කරුණු අනුව ඉන්ඩෙන්ට් මගින් මිල දී ගැනීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතාවයන් හා නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදය මත නොසැපයූ භාණ්ඩ වෙනුවෙන් දරා ඇති රු.4,714,396 ක මුදල රජයට සිදුවූ අලාභයක් බවට පත්ව තිබුණි. | වර්තමානයේ ණයවර ලිපි විවෘත කිරීමේ කොන්දේසි ප්‍රකාරව 100% සම්පූර්ණ මුදලම සැපයුම්කරු වෙත ගෙවීම් සිදු කළ යුතුය. නමුත් සපයා නොමැති භාණ්ඩ පිළිබඳව හඳුනාගත් අවස්ථාවේදීම අදාල සැපයුම්කරුවන් වෙත දන්වා ඒවා නැවත ගෙන්වා ගැනීමට හෝ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br>නමුත් මෙම තත්වය අවම කර ගැනීම සඳහා දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි , සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. | ප්‍රසම්පාදනයන් වලදී වැදගත් සියළු කොන්දේසි ගිවිසුම් ගත කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. මිලදී ගැනීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතා නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදයන් නිසා සිදු වී ඇත්නම් සිදු වූ අලාභය සඳහා වගකීමට බැඳෙන නිලධාරීන්ට එදිරිව පියවර ගත යුතුවේ. |

## 3.9 වත්කම් කළමනාකරණය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය.** | | |
| (i) | මහනුවර ගොඩනැගිලි කාර්යාලයේ 2022 ජනවාරි මස 11 වන දින භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර තිබූ අතර, එහිදී භාණ්ඩ වර්ග 40 ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස පොදු 47 පෝරමය මඟින් මු.රෙ. 877 ප්‍රකාරව ලැයිස්තුගත කර තිබුණද, මෙම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛණයෙන් ඉවත් කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මහනුවර ගොඩනැගිලි කාර්යාලයේ 2019 අගෝස්තු මස 01 දින කරන ලද භාණ්ඩ සමීක්ෂණයකට අනුව අයිතම් 88 ක් භාවිතයට සුදුසු නොමැති ලෙස දක්වා අපහරණය සඳහා යොජනා කර තිබුණද, ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියා පටිපාටි අනුගමනය කර එම ද්‍රව්‍ය ගබඩාවෙන් ඉවත් කිරීම සඳහා මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. |
| **(ආ)** | **ඌන උපයෝජන වත්කම්.** | | |
| **(i)** | අධීක්ෂණ කළමණාකරු ගාල්ල ගොඩනැගිලි අංශය මගින් නඩත්තු කරනු ලබන නිල නිවාස 165 ක් තිබුණ ද නිවාස 48 ක පදිංචිය සඳහා ඉල්ලුම්කර නොතිබුණි. නිල නිවාස පදිංචියෙන් තොර වීම නිසා ඒවා අබලන් තත්ත්වයට පත් වීමත්, ඒ අනුව නිතර නිතර නඩත්තුව සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවන බව විගණනයේදී නිරීක්ෂනය වූ අතර, මෙම නිල නිවාස වල අදාළ පුද්ගලයන් පදිංචි කරවීම හෝ එසේ නොවන්නනේ නම්, වෙනත් දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවය සඳහා තාවකාලික පදනම මත හෝ ලබා දී එයින් යම් ආදායමක් උපයා ගැනීම වැනි ක්‍රියාමාර්ග කෙරෙහි පරිපාලනයේ අවධානය යොමු වී නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් මගින් නිසි ප්‍රයෝජන ලබා ගත යුතු අතර එමගින් ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ SRS ඉන්ධන ගබඩාවෙහි ලිහිසි තෙල් හා අනිකුත් තොග අයිතම් 21 ක් වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබූ අතර ඒවා ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයටද පත්ව තිබුණි. | දැනටමත් දු.සා. ගේ අංක දු.සා/සම්/05/02/19/2021 හා 2021.02.22 දිනැති ලිපිය මගින් අංක. 1,2,3,4,6,7,8,18,19,20,21 දරණ අයිතම ලෝහ හා රසායනාගාර විද්‍යාඥ නිර්දේශය මත ටෙන්ඩර මගින් විකිණීම පිණිස අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඉදිරි ටෙන්ඩරයකට ඇතුලත් කර ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>ඉහත අයිතම සම්බන්ධයෙන් භාවිතා කරන උප දෙපාර්තමේන්තු විමසීමටත් කල්ඉකුත් වීමට පෙර භාවිතයට ගැනීම යලි ඇණවුම් මට්ටම් නැවත සලකා බැලීමටත් කටයුතු කරන බව දන්වමි. | මිලදී ගත් තොග ප්‍රයෝජනයට ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | වවුනියාව බල ප්‍රදේශයට අයත් නිල නිවාස 140 න් නිල නිවාස 54 ක පමණක් නිලධාරීන් පදිංචි වී සිටින බව නිරීක්ෂණය වූ අතර, අනෙකුත් නිල නිවාස අලුත්වැඩියා කළයුතු මට්ටමේ හා ඉතා අබලන් තත්ත්වයේ පැවති බවද නිරීක්ෂණය විය. සමහර නිල නිවාස වල, ජනෙල් දොරවල්, උළුවහු පවා සොරුන් විසින් ඉවත්කර ගෙන ගොස් තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | වත්කම් උපයෝජනය වඩාත් විචක්ෂණව කළ යුතුවේ. |
| **(iv)** | චීනයෙන් ගෙන්වා ඇති මගී මැදිරි 100 න් මේ වන විට ධාවනයට යොදවා තිබූ මගී මැදිරි සංඛ්‍යාව 17 ක් වන අතර අනෙකුත් මැදිරි මාලිගාවත්ත, රත්මලාන අංගන වල ගාල් කර තිබූ අතර තවත් මැදිරි කිහිපයක් පුත්තලම දුම්රිය ස්ථානයේ ගාල් කර තිබුණි. | දැනට චීන මැදිරි 100 පිළිබඳ තත්වය පහත පරිදි වේ.<br>• ධාවනයේ පවතින ගණන - 19 (දුම්රිය කට්ටල 02යි)<br>• ධාවනයට සූදානම්කර ඇති ගණන - 06<br>• අළුත්වැඩියාවට යැවීම සඳහා මාලිගාවත්ත අංගනයේ නවතා ඇති ගණන - 40<br>• මාලිගාවත්ත අංගනයේ අළුත්වැඩියා කරමින් පවතින ගණන - 02<br>• අලුත්වැඩියාවට රත්මලාන කර්මාන්ත ශාලාවට යවා ඇති ගණන - 32<br>• අනතුරට ලක්වීම නිසා ධාවනයෙන් ඉවත්කර ඇති ගණන - 01<br>පුත්තලම දුම්රිය ස්ථානයේ ගාල් කර තිබූ දුම්රියමැදිරි අලුත්වැඩියාවට රත්මලානකර්මාන්ත ශාලාවට යවා ඇත. රත්මලාන කර්මාන්ත ශාලාවට අලුත්වැඩියාවටයවන තෙක් නවතා තැබීමට තැනක් නොමැති නිසා තාවකාලිකව පුත්තලම දුම්රිය ස්ථානයේ නවත්වා තබන ලදී.<br>මාලිගාවත්ත අංගනය පුලුල් කර මැදිරි කට්ටල නවතා ගැනීමට ඇති හැකියාව නැති වන සේ මාලිගාවත්ත අංගනයට අයත් දුම්රිය ඉඩමේ කොටසක් අවිධිමත් ලෙස බාහිර පාර්ශව වලට පවරා තිබුණි. එම ඉඩම නිදහස් කර ගෙන දුම්රිය මැදිරි නවතාලිය හැකි පරිදි අංගනය පුලුල් කිරීම ප්‍රමාද වීම නිසා පුත්තලම, අනුරාධපුරය, ගල්ඔය වැනි බැහැර ස්ථාන වල අලුත්වැඩියා කිරීමට නියමිත මැදිරි නවතා තැබීමට සිදුව තිබේ. | මිලදී ගත් මගී මැදිරි සියල්ල ධාවනයට යෙදවීය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(v)** | මහනුවර අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) කාර්යාලයේ නිල නිවාස 272 ක් නඩත්තු වන අතර ඉන් පදිංචිය සඳහා දැනට භාවිතයට නොගන්නා නිල නිවාස ගණන 96 ක් විය. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට පියවර ගත යුතුවේ. |
| **(vi)** | වැව්රුකන්නල ඉදිකර තිබූ විශාල ප්‍රමාණයේ කාමර 07 කින් සමන්විත සංචාරක නිවාසය 2019 සිටම නිශ්කාර්යව පවතින අතර මුරකරුවකු යොදා එයට ආරක්ෂාව සැපයුවද ගොඩනැගිල්ල හා කාමර සියල්ල ජරාවාස වී තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කර එහි ආර්ථික වාසි ලබා ගත යුතුවේ. |
| **(vii)** | කැකණදුර හා බෙලිඅත්ත බහුකාර්ය ගොඩනැගිලි වල ඇති සුපිරි වෙළඳසැල් සඳහා භාවිත කළ හැකි පිළිවෙළින් වර්ග අඩි 2637 ක් හා 1730 ක් වශයෙන් වූ ගොඩනැගිලි 2019 සිටම නිශ්කාර්යව පවතින අතර එම ගොඩනැගිලි බාහිර පාර්ශවයන් විසින් විවිධ සමාජ විරෝධී ක්‍රියාවලට භාවිත කරන බව නිරීක්ෂණය විය. තවද එම ගොඩනැගිලි වල් බිහිවී ජරාවාස වී තිබුණි | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කර එහි ආර්ථික වාසි ලබා ගත යුතුවේ. |
| **(ඇ)** | **ඉඩම් බදු දීම.** | | |
| **(i)** | ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි නියෝජිතයෙකු වෙත වාලච්චේන ප්‍රධාන පාරෙන් අංක LA/01/16 අනුව ලබා දී තිබූ පර්චස් 20.6 ක දුම්රිය රක්ෂිත 2013 අගෝස්තු 31 දින සිට බදු ලබා දෙන ලෙස දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණි. මේ සඳහා 2016 පෙබරවාරි 07 දින දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් අනුමැතිය ලබා දී තිබුණද 2022 දෙසැම්බර් 31 දිනටද මෙම ඉඩම බදු ලබ දී නොතිබූ අතර ඉඩම පරිහරණය කිරීම සම්බන්ධයෙන් වූ ගාස්තු රු.1,420,975 ක් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | විධිමත් පරිදි ගිවිසුම්ගතව බදු ලබා දීම් සිදු කළ යුතු අතර අනවසර පරිහරණය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හෝ පරිහරණ ගාස්තු අයකර ගැනීම සිදු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | දුම්රිය දෙපාර්තමේන්තු සතුව පවත්නා රක්ෂිත ඉඩම් පිටස්තර පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කර ගැනීම් නිරීක්ෂණය වූ අතර "දුම්රිය රක්ෂිත සම්බන්ධ ගොනු විස්තර ලේඛන" පරීක්ෂා කිරීමේ දී උතුරු දුම්රිය මාර්ගයට අයත් ඉඩම් අනවසරයෙන් අල්ලා ගත් අවස්ථා 39 ක් පැවතුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | නීතිරීති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| **(iii)** | 2018, 2019 යන වසර වලදී මෙම දුම්රිය රක්ෂිත ඉඩම් වලින් කොටසක් අවුරුදු සමයේදී තාවකාලිකව බදු ලබා දී ඇති ජංගම වෙළඳසැල් වලින් රු. ලක්ෂ 06 ක පමණ ආදායම් ලබා ගෙන තිබුණු බවද ලේඛණ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, වර්තමානයේදී එවැනි විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම මඟින් අනවසර වෙළඳුන් දුම්රිය රක්ෂිතයන්, තම ව්‍යාපාරික කටයුතු සඳහා ගෙවීමක් රහිතව භාවිතයට ගෙන තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | දුම්රිය රක්ෂිතයන් විධිමත් පරිදි බදු ලබාදී ආදායම් අයකර ගත යුතුවේ. |
| **(iv)** | යාපනය දුම්රිය ස්ථානය අසල ඇති අධීක්ෂණ කළමණාකරු මාර්ග හා කර්මාන්ත කාර්යාලය අසලින් ආරම්භවී රෝහල පාර, වෙරළ පාර, නුවර පාර හරහා ගොස් යාපනය ජැටිය දක්වා දුම්රිය මාර්ගයක් පැවත තිබී ඇති අතර එම දුම්රිය මාර්ගය හා ඊට අදාළ දුම්රිය රක්ෂිත ඉඩම් සියල්ල ප්‍රදේශ වාසීන් විසින් අත්පත් කරගෙන වසර 20 කට වැඩි කාලයක සිට භුක්ති විඳිමින් පවතී. මේ සම්බන්ධව වගකිව යුතු දුම්රිය බලධාරීන් කිසිදු පියවරක් නොගැනීම තුළින් මෙම දේපළ අවභාවිතයට ලක්වී තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | දුම්රිය රක්ෂිතයන් විධිමත් පරිදි බදු ලබාදී ආදායම් අයකර ගත යුතුවේ. |
| **(ඇ)** | **නිශ්ක්‍රීය වත්කම්.** | | |
| **(i)** | කුරුණෑගල දුම්රිය ස්ථානයේ පරිගණක යන්ත්‍ර මගින් ආසන වෙන්කර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම නිකුත් කරන ලද රු.42,680,625 ක් වටිනා මුද්‍රිත ප්‍රවේශ පත්‍ර 108,133 ක් භාවිතයෙන් ඉවත් කර තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | භාවිතයට නොගන්නා තොග අපහරණය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත යැවිය යුතු අලෙවි නොවන රු.7,949,590 ක් වටිනා දුම්රිය ප්‍රවේශ පත්‍ර 35,602 ක් ගම්පහ, ගනේවත්ත, කුරුණෑගල, අඹේපුස්ස යන දුම්රිය ස්ථාන වල තිබූ අතර ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | භාවිතයට නොගන්නා තොග අපහරණය කළ යුතුවේ. |
| **(iii)** | ඉහල දිස්ත්‍රික්කයේ නානුඔය ස්ථිර මාර්ග බල ප්‍රදේශය තුල නානුඔය මාර්ග අංශයේ වැරුම් පීලි සවිකල වංගු ආසන්න වශයෙන් දම්වැල් 805 ක් පමණ වන අතර ඉන් දම්වැල් 382 ක් පමණ ඇත්තේ රේල් පීලි වලින් සකසන ලද වැරුම් පීලි වන අතර ඉතිරි දම්වැල් 423 ම ආනයනය කරන ලද වැරුම්පීලි (Bulb Angle Checkrail) වේ. මෙම අංශයේ ඇති ආනයනය කල සියළු වැරුම් පීලි වල නිෂ්පාදන වර්ෂය 1900 ත් 1910 ත් වන අතර ඒවා සියල්ලම මේ වන විට ගෙවී ගොස් භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | නියමිත කාල වලදී අලුත්වැඩියාවන් සිදු කළ යුතු අතර අපහරණයන් විධිමත් පරිදි සිදු කළ යුතුවේ. |
| **(ඉ)** | **වාහන පාලනය.** | | |
| | දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වාහන 08 ක් අනතුරු වලට පත්වී අකර්මණ්‍ය වී තිබූ අතර ඒවා සම්බන්ධයෙන් මු.රෙ. 104 හි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.10 පාඩු හා හානි.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | මාර්ගගත ක්‍රමවේදයට ආසන වෙන් කිරීමේ පද්ධතිය යාවත්කාලීන කිරීම එකම නිලධාරියෙකු මත පැවරී තිබීම හේතුවෙන්, 2022 මාර්තු 24 දින අංක 1029/1030 යන දුම්රියේ සිදු වූ වෙනස, යාවත්කාලීන කිරීමට දින 03 ක් ගතවී තිබුණු බවත් එය ක්ෂණිකව යාවත්කාලීන කිරීමට නොහැකි වී | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | අවස්ථානුකූලව විධිමත් පරිදි බලතල පැවරිය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | තිබීම මත රු.464,650 ක මූල්‍ය පාඩුවක් රජයට දැරීමට සිදු වී තිබුණි. | | |
| (ආ) | හානි පාඩු ලේඛන වල ඇතුළත් වූ වටිනාකම රු.1,933,381 ක් වූ හානි හා පාඩු, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් වී නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | සියලුම හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කළ යුතුවේ. |

**3.11 අනාර්ථික ගනුදෙනු.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නානුඔය ස්ථිරමාර්ග බල ප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් හා අත්පත් කර ගැනීම් 12 ක් වාර්තා වී තිබූ අතර එම අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට හා එම භූමි භාගයන් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | අනවසර පරිහරණයන් වළක්වා ගෙන විධිමත් පරිදි පවරාගත යුතුවේ. |

**3.12 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම.**

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ගනුදෙනු පරීක්ෂා කිරීම වෙනුවෙන් නිකුත් කළ විගණන විමසුම් 21 ක් සඳහා මේ දක්වා පිළිතුරු සපයා නොතිබුණි. | 2022 වර්ෂයේ විගණකාධිපති විමසුම් 67ක් ඉදිරිපත්විණි. 2022.12.31 දින වන විට එයින් 43ක් සඳහා පිළිතුරු සපයා ඇත. ඉතිරි 24කි. එයින් 2023 අප්‍රේල් මස අවසන් වන විට 20ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීමට අත ඉතිරි වේ. ඒ සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු යොදා ඇති බව පෙන්වා දෙමි. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව දින 21 ක් තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිය යුතුවේ. |

**3.13 කළමනාකරණ දූර්වලතා.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතික වීමෙන් අනතුරුව අදාළ ගෙවීම් සඳහා අනුමැතිය ලබා දිය යුතු වුවත් එසේ තහවුරු කර | මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි, සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු | විධිමත් පරිදි සහතික වීම්, අනුමැතීන් යටතේ පමණක් ගනුදෙනු සිදු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමකින් තොරව ණයවර ලිපියේ මුළු වටිනාකම ගෙවීම් කර තිබුණ ද කොන්ත්‍රාත් මුදලින් සියයට 63 ක් වටිනා භාණ්ඩ නුසුදුසු තත්ත්වයේ පැවතීම හා නැවත අයකර ගත නොහැකි ආකාරයට වගකීම් කාලය ඉක්මවා තිබුණි. | ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමටත් ලේඛන සැකසීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින් මේ වන විට අදාළ ලංසු ලේඛන කෙටුම්පත් කර ඇති අතර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී මෙම තත්වය බොහෝ දුරට අවම කරගත හැකි බව දන්වමි. | |
| (ආ) | ගනේවත්ත දුම්රිය ස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකි ලෙස දැඩි ලෙස අබලන්ව තිබූ අතර එය භාවිතයෙන් ඉවත් කර තිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | එදිනෙදා කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දිය යුතුවේ. |
| (ඇ) | Rails හා Dog Spikes යන ද්‍රව්‍යයන් ගනේවත්ත ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල භූමිය තුළ තිබූ බව නිරීක්ෂණය වූ අතර මෙම ද්‍රව්‍ය වර්තමාන වෙළඳපොළේ පවතින ඉල්ලුමට අනුව අබලි යකඩ ලෙස හෝ ලබා දීම කෙරෙහි පරිපාලනයේ අවධානය යොමුව නොතිබුණි. මෙම ද්‍රව්‍ය විධිමත් ක්‍රමවේදයකට අනුව අලෙවි කිරීමට හැකිවන්නේ නම් රු.14,788,800 ක ආදායමක් ලබා ගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව අපහරණයන් සිදු කර ආදායම් ලබා ගත යුතුවේ. |
| (ඇ) | දුම්රිය ස්ථාන 05 කට අදාළව No Debits (හර නැති බැර) ලේඛණ වල දීර්ඝ කාලයක් පවතින රු. 2,895,900 ක ශේෂයක් රජයේ ආදායමට ගැනීමට හෝ එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | දිගු කාලීනව පවතින ශේෂ නිරවුල් කළ යුතුවේ. |
| (ඉ) | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත යැවිය යුතු සෙමින් අලෙවි වන රු. 2,367,040 වටිනා දුම්රිය ප්‍රවේශ පත්‍ර 7497 ක් අඹේපුස්ස දුම්රිය ස්ථානයේ තිබූ බව නිරීක්ෂණය විය. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රධාන කාර්යාලය වෙත යැවීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | භාණ්ඩ ආනයනය කිරීමේදී නිශ්කාෂණ කටයුතු කාර්යක්ෂමව හා කඩිනමින් ඉටුකර නොගැනීම මත වාර්ෂිකව විශාල මුදලක් ප්‍රමාද ගාස්තු හා පොළී වශයෙන් ගෙවීමට සිදුව ඇති අතර සමාලෝචිත වර්ෂය තුල එසේ ගෙවා ඇති මුදල රු.5,044,787 ක් විය. ප්‍රමාද ගාස්තු හා පොළී ගෙවීම ආයතනයේ සාමාන්‍ය කටයුත්තක් බවට පත්ව තිබූ අතර ගබඩා අත්තිකාරම් ගිණුමට අදාළව 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවන ලද ප්‍රමාද ගාස්තු හා පොළී වටිනාකම රු.73,921,280 ක් වි තිබුණි. | ආනයනික භාණ්ඩ සඳහා ගෙවීමේදී ලියකියවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත බැංකුව විසින් අය කරන ලද පොලී වටිනාකම හා සමාලෝචිත වර්ෂය තුළදී ආනයනික භාණ්ඩ සඳහා දැරූ ප්‍රමාද ගාස්තු සහ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ප්‍රමාණය අනුව භාණ්ඩ නිෂ්කාශනය සිදුකරන බැවින් ලැබෙන අක්මුදල් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් නැව් සංස්ථාවට ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වීම නොවැළැක්විය හැකි තත්ත්වයක් බව පෙන්වා දෙමි. | ප්‍රමාද ගාස්තු හා පොලී ගෙවීම් වලට හේතු සොයා බලා භාණ්ඩ ආනයනය කිරීමේ යාන්ත්‍රණය කාර්යක්ෂම කළ යුතුවේ. |
| (උ) | ගාල්ල ස්ථිර මාර්ග පරීක්ෂක බලප්‍රදේශය තුළ ස්ථාන කිහිපයක ස්ථානගතව පවතින දික් අඩි 6000 ක Rails ප්‍රමාණය තොග පොත් වල සටහන් වී නොතිබූ අතර 2022 මුල් මාස වලදී සමීක්ෂණයකින් සොයා ගන්නා ලද මෙම අබලි (scrap) Rails ප්‍රමාණය විධිමත් ලෙස තොග පොත් වලට ගෙන, එය වර්තමානයේ පවතින වෙළඳපොළ මිල ගණන් යටතේ විකිණීමෙන් ලබාගත හැකිව පවතින රු.13,440,000 ක ආදායම පිළිබඳව පරිපාලනයේ අවධානය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යොමුවී නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ඉවත් කරන Rails පිළිබඳ තොග පොත් වල වාර්තා තබා ගත යුතු අතර ඒවා විධිමත් පරිදි අපහරණය කර ආදායම් උත්පාදනයට පරිපාලනයේ අවධානය යොමු විය යුතුවේ. |
| (ඌ) | මහනුවර ස්ථිර මාර්ග පරීක්ෂක බල ප්‍රදේශය තුළ Scrap Rails ලෙස 45` - 30` දික් අඩි 15174` ක් හා අනෙකුත් වර්ග වලින් දික් අඩි 6285 ක් වශයෙන් දික් අඩි 21459` ක් පැවති අතර, මේවා සඳහා වෙළඳපල තුළ තිබෙන ඇඩි ඉල්ලුම පදනම් කර ගෙන දික් අඩියක් රු.2000 බැගින් (වැට් හා අනෙකුත් බදු රහිතව) විකිණීම මගින් ලබා ගත හැකිව තිබෙන රු.42,918,000 ක ආදායම ලබා ගැනීම කෙරෙහි පරිපාලනයේ අවධානය යොමු වී නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම් උපයාගත හැකි අයිතම තුළින් ආදායම් ජනිත කර ගැනීමට පරිපාලනය කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| **(එ)** | ගාල්ල ස්ථිර මාර්ග පරීක්ෂක බල ප්‍රදේශයේ රු.27,831,650 ක් වටිනා භාවිතයට ගත නොහැකි අබලි යකඩ ද්‍රව්‍ය තොගයක් වූ අතර එම ද්‍රව්‍ය විකුණා ලබා ගත හැකිව තිබූ ආදායම පිළිබඳව පරිපාලනයේ අවධානය යොමුවී නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම් උපයාගත හැකි අයිතම තුළින් ආදායම් ජනිත කර ගැනීමට පරිපාලනය කටයුතු කළ යුතුවේ. |
| **(ඒ)** | වැලිගම ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල පරිශ්‍රය තුළ නැවත භාවිතයට ගත නොහැකි දික් අඩි 605’6” Rails තොගයක් අනාරක්ෂිතව ගබඩා කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර යකඩ සඳහා දැඩි ඉල්ලුමක් පවතින වතාවරණයක් තුල පවතින වෙළඳපල මිල අනුව රු.1,356,320 ක ආදායමක් දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට හැකිව තිබූ අවස්ථාව පිළිබඳ පරිපාලනයේ අවධානය යොමුවී නොතිබුණි. | මෙම අවස්ථාවේ දී මෙයට පිළිතුරු ලබා දීම සඳහා අදාල උපදෙපාර්තමේන්තුවේ තහවුරුව ලබාගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවුණු බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම් උපයාගත හැකි අයිතම තුළින් ආදායම් ජනිත කර ගැනීමට පරිපාලනය කටයුතු කළ යුතුවේ. |
| **(ඔ)** | 2017 හා 2018 වර්ෂයන් වල ආරම්භ කරන ලද භාවිතයට ගත නොහැකි අබලි යකඩ කිලෝ 3,113,080 ටෙන්ඩර මඟින් විකිණීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණි. | | |
| **(i)** | ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් නොකිරීම. | පිළිතුරු සපයා නොමැත. | ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කළ යුතුවේ. |
| **(ii)** | තාක්ෂණ කමිටුව විසින් වාර්තා දෙකක් අවස්ථා 2 කදී ලබා දී තිබීම. | පිළිතුරු සපයා නොමැත. | රජයට අලාභ නොවන පරිදි කාලීනව විනිවිදභාවයෙන් යුතුව ටෙන්ඩර් විකිණීම සිදු කිරීම හා රජයට අලාභ වන ලෙස කටයුතු සිදුවී ඇති අවස්ථා සම්බන්ධව නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුවේ. |
| **(iii)** | තාක්ෂණික කමිටුව විසින් මුල් වාර්තාව සඳහා සලකා නොලැබූ ආයතන දෙවන අවස්ථාවේදී සලකා බලා එම ආයතනයන් වෙත ටෙන්ඩරය පිරිනැමීම හා එහිදී උපරිම මිල වෙනුවට අඩු මිලක් ලැබී තිබීම. | පිළිතුරු සපයා නොමැත. | |
| **(iv)** | ටෙන්ඩර් කමිටුව ටෙන්ඩරය ප්‍රදානය කළ තීරණය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අවලංගු කර නැවත වසර 02 කට පසුව එම ආයතන වලට ලබා දීම. | පිළිතුරු සපයා නොමැත. | |

| | | |
|---|---|---|
| **(v)** | ටෙන්ඩරය හිමිකරගත් ආයතන විසින් වැඩි මිලට (රු. 60) යකඩ ඉල්ලුම් කර තිබියදී එය දුම්රිය නිලධාරීන් ප්‍රතික්ෂේප කර තිබීම ද හේතුවෙන් රු.31,898,426 අහිමි වීම. | පිළිතුරු සපයා නොමැත. |
| **(vi)** | මෙම කටයුතු බේරුම් කරන ක්‍රියාවලියට යොමු වීම හේතුවෙන් රජයට රු.944,600 දැරීමට සිදුවීම. | පිළිතුරු සපයා නොමැත. |
| **(vii)** | මුල් අවස්ථාවේදීම අවම මිල යටතේ වුවද ටෙන්ඩරය ප්‍රදානය කලේ නම් එකී මුදල සඳහා තත්කාලයේ ලැබිය යුතු ආයෝජන පොළිය රු.44,917,048 ක් රජයට අහිමි වී තිබීම. | පිළිතුරු සපයා නොමැත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2030 තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රයේ සඳහන් අරමුණු කරා ළඟා වීමට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සිය විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු සකස් කර තිබුණද එහි ප්‍රගතිය මැන බැලීම සඳහා වන ඉලක්ක හඳුනා ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැළපෙන පරිදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගත යුතු අතර එහි ප්‍රගතිය මැන බැලීමේ දර්ශක ඊට අනුකූලව හඳුනාගත යුතුවේ. |

**5. යහපාලනය.**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය මාර්ග පද්ධතියේ පවතින ගැටළු හා පවතින වෙනත් දුර්වලතාවයන් හේතුවෙන් 2022 වර්ෂයේදී පමණක් දුම්රිය පීලි පැනීම් 117 ක් වාර්තා වී තිබුණි. මේ හේතුවෙන් දුම්රිය මාර්ගයට සිදුවූ පාඩුව හා එය යථාවත් කිරීමට වැය වූ පිරිවැය දෙපාර්තමේන්තුව විසින් නිසි පරිදි නිශ්චය කර නොතිබූ අතර ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට ද අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව හා විනය කාර්ය පරිපාටි අනුව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය.

### 6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල දත්ත අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ථ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 8821 ක් විය. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 43 ක ප්‍රමාණයකි. | එකඟයි. ප්‍රාථමික මට්ටමේ අනුමත ගණන 4043 කි. දැනට පුරප්පාඩු නොමැත. | හැකි ඉක්මනින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. |

### 6.2 මානව සම්පත් සංවර්ධන සැලැස්ම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලලේඛ අංක 2/2018 ප්‍රකාරව රාජ්‍ය ආයතන තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ චක්‍රලේඛය මඟින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය තුළ කේන්ද්‍ර වී පවත්නා මානව සම්පත රටේ සංවර්ධනය උදෙසා වඩාත් කාර්යක්ෂම හා සඵලදායී ලෙස යොදා ගැනීම පිණිස රාජ්‍ය අංශය සතු මානව සම්පත සැලසුම් සහගතව යොදා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව මඟපෙන්වීම් ලබා දී තිබුණි. ඒ අනුව යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම සඳහා චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගනිමින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කරගෙන 2018 වර්ෂයේ සිට සිදු කළ යුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදු කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කෙරෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |